ශ්‍රී ලංකා විශ්‍රාම
இலங்கை ஓய்வு
Sri Lanka Pensions

# 2024

## වාර්ෂික කාර්ය සාධන වාර්තාව සහ ගිණුම්

## வருடாந்த செயற்றிறன் அறிக்கை மற்றும் கணக்குகள்

## Annual Performance Report & Accounts

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
ஓய்வூதியத் திணைக்களம்
Department of Pensions

# කාර්ය සාධන වාර්තාව සහ ගිණුම් - 2024

වැය ශීර්ෂ අංකය - 253

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

මාලිගාවත්ත

කොළඹ 10

# පටුන


**1. ආයතනික පැතිකඩ**

1.1. හැඳින්වීම ....................................................................................................1

1.2. දැක්ම, මෙහෙවර හා අරමුණු ....................................................................................2

1.3. ප්‍රධාන කාර්යයන්.................................................................................................... 3

1.4. සංවිධාන සටහන ............................................................................................... 4-5

1.5. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ ....................................................................................6

**2. ප්‍රගතිය හා ඉදිරි දැක්ම**

විශේෂ ව්‍යාපෘති.......................................................................................................7-21

අභියෝග ...........................................................................................................21-22

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ ඉදිරි ගමන්මග ...............................................................22

**3. 2024.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය**

3.1. මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය ....................................................................................23

3.2. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය...................................................................................24

3.3. මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය.......................................................................................25

3.4. මූල්‍ය ප්‍රකාශ සටහන්.................................................................................................26

3.5. ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය............................................................................27

3.6. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය.............................................27

3.7. මු.රෙ.208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන.......................................................................................................28

3.8. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය..........................................................28

3.9. පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදල් ගිණුම් ..........................................................29-30

3.10. 2024.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ ආදායම් ගිණුම් (පළාත් සභා සහ මධ්‍යම රජය)..................................................................31-38

3.11. ගුරු වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් ගිණුම .....................................................39-41

3.12. රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ගිණුම් ........................................................................42-43

3.13. විගණකාධිපතිවරයාගේ වාර්තාව.................................................................................44-70

**4. කාර්ය සාධන දර්ශක**

4.1. ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)....................................71-77

**5. තිරසාර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්ය සාධනය**

5.1. හඳුනා ගන්නා ලද තිරසාර සංවර්ධන අරමුණු...................................................................79

5.2. තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග..........................................79

**6. මානව සම්පත් පැතිකඩ**

6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය..............................................................................................81

6.3. මානව සම්පත් සංවර්ධනය...................................................................................................81-85

**7. අනුකූලතා වාර්තාව** ......................................................................................................87-93

# 01.
# ආයතනික පැතිකඩ

## 1.1. හැඳින්වීම

වර්ෂ 1970 දී රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය යටතේ "ඒ" ශ්‍රේණියේ දෙපාර්තමේන්තුවක් ලෙස ස්ථාපිත කර ඇති විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව ශ්‍රී ලාංකීය රාජ්‍ය අංශයේ විශ්‍රාමික ප්‍රජාව වෙත සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ හිමිගන්වනු ලබන ප්‍රමුඛතම ආයතනය වේ.

ශ්‍රී ලංකාවේ විශ්‍රාම වැටුප් නීතිය මෙරටට නිදහස ලැබීමට පෙර සිටම, එනම් 1898 ජූනි මස 23 දින සිට බලාත්මක වූ 1898 අංක 01 දරන වැන්දඹු අනත්දරු අරමුදල් ආඥා පනතට අනුව ක්‍රියාත්මක කිරීම ආරම්භ වී ඇත. එතැන් සිට රාජ්‍ය සේවකයින්ගේ විශ්‍රාම වැටුප් ගෙවීම් කළමනාකරණය කිරීමේ කාර්යභාරය මහ භාණ්ඩාගාරය යටතේ සිදුවී ඇත.

1934 පෙබරවාරි 05 දින නිකුත් කරනු ලදුව 1972 මැයි 05 දින නැවත ප්‍රතිශෝධනය කොට හා කලින් කල සංශෝධනයන්ට ලක්වූ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය, 1898 අංක 01 දරන වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් ආඥා පනත හා 1942 අංක 18 දරන රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ආඥා පනත යන අණපනත් මූලික කොට විශ්‍රාමිකයින් සඳහා ප්‍රතිලාභ හිමිගැන්වීම හා ගෙවීම් කරනු ලබයි. එමෙන්ම 1953 අංක 44 දරන ගුරු වැන්දඹු අනත්දරු අරමුදල් පනත සහ පිරිවෙන්, උපකෘත පාසල් සඳහා වූ විශ්‍රාම වැටුප් රෙගුලාසි, 1981 සන්නද්ධ හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික ව්‍යවස්ථා සංග්‍රහය හා 1970 අංක 18 දරන වැන්දඹු අනත්දරු (සන්නද්ධ හමුදා) පනත, පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් ක්‍රමයන් ද ක්‍රියාත්මක වේ.

ඉහත නෛතික ප්‍රතිපාදනයන්ට අනුකූලව සිවිල් විශ්‍රාම වැටුප්, වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු හා ආබාධිත අනත්දරු විශ්‍රාම වැටුප්, සන්නද්ධ හමුදා විශ්‍රාම වැටුප් හා රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් යන විෂයයන්ට අදාළව සියලු ගෙවීම් හා අයකිරීම් නියාමනය කිරීම විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ ප්‍රමුඛතම කාර්යභාරය වේ.

එමෙන්ම ඩිජිටල් තාක්ෂණික උපාය මාර්ග හා සන්නිවේදන නව්‍යකරණයන් හා යාවත්කාලීන වෙමින් මේ වන විට විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රමවේදය සරල කිරීමට හැකියාව ලැබී ඇති අතර 725,000 කට අධික විශ්‍රාම වැටුප් ක්‍රමයේ ප්‍රතිලාභ ලබන විශ්‍රාමිකයින්ගේ සහ ඔවුන්ගේ උරුමකරුවන්ගේ ප්‍රතිලාභ තහවුරු කිරීමට මෙන්ම විශ්‍රාම වැටුප් ගෙවීමෙන් ඔබ්බට සමාජ හා ආර්ථික වශයෙන් තෘප්තිමත් විශ්‍රාමිකයකු බිහි කිරීම වෙනුවෙන් පෙරගමන්කරුවෙකු ලෙස කටයුතු කරනු ලබන මෙම දෙපාර්තමේන්තුව මේ වන විට අඩ සියවසක් ඉක්මවූ ඉතිහාසයකට හිමිකම් කියනු ලබයි.

රාජ්‍ය මුදල් චක්‍රලේඛ 02/2020 ට අනුකූලව 2024 මුදල් වර්ෂය තුළ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව සිදු කරන ලද සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ කළමනාකරණය හා හිමිගැන්වීමේ ක්‍රියාවලිය හා මූල්‍ය ක්‍රියාකාරකම් හි සාධනීය තත්ත්වය පිළිබඳ විස්තර ඇතුළත් කරමින් මෙම වාර්තාව සකස් කර ඇත.

## 1.2. දැක්ම, මෙහෙවර හා අරමුණු




**දැක්ම**

ආර්ථික හා සාමාජීය වශයෙන් තෘප්තිමත් විශ්‍රාමික ප්‍රජාවක්




**මෙහෙවර**

රාජ්‍ය සේවා විශ්‍රාමිකයන් හා ඔවුන්ගේ ප්‍රතිලාභීන් සඳහා තොරතුරු තාක්ෂණය හා තිරසාර කළමනාකරණ ක්‍රමවේද භාවිතයෙන් ද, පෞද්ගලික හා රාජ්‍ය අංශ මුහුවෙන් ඉහළ සේවාලාභී හා සේවාදායක තෘප්තිය තහවුරු කරමින් නෛතික ප්‍රතිලාභයන් පිළිගැන්වීම

**අරමුණු**

- රාජ්‍ය සේවක විශ්‍රාම ප්‍රතිලාභ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය හා වැන්දඹු හා අනත්දරු ආඥා පනත හා වැන්දඹු පුරුෂ හා අනත්දරු පනතට අනුකූල වන පරිදි හිමිගැන්වීමේ ක්‍රියාවලිය නියාමනය කිරීම හා ඊට අදාල විධිවිධානයන් පැනවීම.
- විශ්‍රාම වැටුප් සම්බන්ධ නෛතික රාමු, රීතීන්ට හා ප්‍රතිපත්ති තීරණවලට අනුකූලව රාජ්‍ය සේවකයින්ගේ විශ්‍රාම වැටුප  හිමිගැන්වීම.
- මාසික විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අඛණ්ඩව ගෙවීම හා එක්වරක් පමණක් ගෙවන ප්‍රතිලාභ නිරවද්‍යතාවයකින් යුක්තව හිමිගැන්වීම.
- රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල් ක්‍රමය නියාමනය හා ප්‍රතිලාභ හිමිගැන්වීම.
- රජය වෙනුවෙන් වැන්දඹු අනත්දරු දායක මුදල් රැස්කිරීම හා අනෙකුත් ආදායම් රැස්කිරීම හා කළමනාකරණය කිරීම.
- සන්නද්ධ හමුදා විශ්‍රාම වැටුප් හා පසු ප්‍රතිලාභ කළමනාකරණය.
- සක්‍රීය සේවයේ යෙදී සිටිය දී ජීවිතක්ෂයට හෝ දුබලතාවයට පත් වූ ත්‍රිවිධ හමුදා හා පොලිස් සේවා සාමාජිකයන්ට වන්දි වැටුප් හා දීමනා ගෙවීම.
- සමාජ ආරක්ෂණය පිළිබඳ ගෝලීය හා නව්‍යකරණයේ ප්‍රවණතා අධ්‍යයනය කරමින් නූතන සමාජ ආරක්ෂණ ක්‍රමයන් පිළිබඳව ප්‍රතිපත්ති සම්පාදනය සඳහා සහාය වීම.
- වාර්ෂික අයවැය පිළියෙල කිරීම හා ප්‍රගතිය පිළිබඳව ව්‍යවස්ථාදායකයට වගවීම.
- ජාතික විශ්‍රාමික දින සැමරුම් උළෙල පැවැත්වීම.

## 1.3. ප්‍රධාන කාර්යයන්

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු සමස්ත කාර්යභාරය ක්‍රියාවලි හතරක් ඔස්සේ සිදු කරනු ලැබේ.

### 1.3.1 විශ්‍රාම වැටුප් හා ප්‍රතිලාභ ප්‍රදානය

I. **රජයේ හා අධිකරණ නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප් හිමිගැන්වීම**

රාජ්‍ය සේවකයින්, අධිකරණ, පිරිවෙන් ගුරු, පෞද්ගලික පාසල් ගුරු සහ "ට" උප ලේඛනය ට ඇතුළත් කර ඇති නිලධාරීන් හට විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන අනුව විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික හිමිගැන්වීම.

II. **සන්නද්ධ සේවාවන් සඳහා විශ්‍රාම වැටුප් හිමිගැන්වීම**

සන්නද්ධ සේවා නිලධාරීන් හා සෙසු නිලයන්ට විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික හිමිගැන්වීම, වන්දි වැටුප් හා දීමනා, දුබලතා විශ්‍රාම වැටුප්, ස්ථාවර මාසික දීමනා හා යැපෙන්නන්ගේ දීමනා හිමිගැන්වීම.

III. **වැන්දඹු හා අනත්දරු හෝ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් හිමිගැන්වීම**

සිවිල් අධිකරණ හා හමුදා  සේවකයකුගේ හෝ විශ්‍රාමිකයකුගේ අභාවයකින් අනතුරුව වැන්දඹු හෝ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම ආරම්භ කිරීම, රාජ්‍ය සේවයේ යෙදී සිටියදී මියයන රාජ්‍ය සේවකයින් සඳහා මරණ පාරිතෝෂික හිමිගැන්වීම, අනත්දරු හා ආබාධිත විශ්‍රාම වැටුප් හිමිගැන්වීම.

IV. **රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභ හිමිගැන්වීම**

රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් රහිත පත්වීම් දරන්නන් වෙත සේවා අවසාන ප්‍රතිලාභ ගෙවීම.

### 1.3.2 ගෙවීම් නියාමනය

විශ්‍රාම වැටුප්, වැන්දඹු, වැන්දඹු පුරුෂ, අනත්දරු හා ආබාධිත විශ්‍රාම වැටුප් ආදී මාසිකව සිදු කරන ගෙවීම් ද, රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභ ගෙවීම්, වැන්දඹු හා අනත්දරු අරමුදල් ආපසු ගෙවීම්, විශ්‍රාම වැටුප් පාරිතෝෂික ගෙවීම්, මරණ පාරිතෝෂික ගෙවීම්, උරුමකරු ගෙවීම්, විශ්‍රාම වැටුප් හිමිකම නොලබා සේවයෙන් ඉවත්වන සන්නද්ධ සේවා නිලධාරීන්ගේ සේවා පාරිතෝෂික හා සිවිල් සේවා පාරිතෝෂික සැකසීම, විශේෂ වන්දි ගෙවීම්, විදේශගත විශ්‍රාමිකයින්ගේ විශ්‍රාම වැටුප් ගෙවීම් නිරවද්‍යතාවයෙන් යුතුව නියාමනය කිරීම.

### 1.3.3 ලැබීම් නියාමනය

මධ්‍යම රජය, පළාත් සභා සහ පළාත් පාලන ආයතනයන්හි සමාජ සංරක්ෂණයන්ට අදාළ වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු දායක මුදල් ලැබීම්, පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදල් ලැබීම්, රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ලැබීම්, ගුරු වැන්දඹු හා අනත්දරු අරමුදලේ දායක මුදල් ලැබීම්, ගොඩනැගිලි කුලී සහ නිවාඩු නිකේතන ආදායම් නියාමනය කිරීම.

### 1.3.4 සංවර්ධන ප්‍රවේශය

රජයේ ප්‍රතිපත්ති රාමුව හා තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම ඉලක්ක කර ගෙන ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට සහාය වීම, සමාජ ආරක්ෂණ ප්‍රතිපත්ති සම්බන්ධයෙන් නිරන්තර අධ්‍යයනය කිරීම, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු සේවාලාභීන්ට නැතහොත් ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට රාජ්‍ය හා පුද්ගලික ආයතන  සම්බන්ධ කර ගනිමින් විශේෂ ප්‍රතිලාභ හිමිගැන්වීම හා රජයේ ඉලක්ක සපුරාගත හැකි වන පරිදි මානව හා භෞතික සම්පත් නිරන්තරව සංවර්ධනය කර ගනිමින් කටයුතු කිරීම.

## 1.4. සංවිධාන සටහන



අධ්‍යක්ෂ ජනරාල්
අධ්‍යක්ෂ මණ්ඩලය (රා.සේ.අ.)
ලේකම් හා ගණකාධිකාරී (රා.සේ.අ.)
පරිපාලන නිලධාරී
ශාඛා ප්‍රධානී
සහයක කාර්ය මණ්ඩලය
ප්‍රධාන මූල්‍ය නිලධාරී
ප්‍රධාන ගණකාධිකාරී
ගණකාධිකාරී I
ගණකාධිකාරී (දෙපාර්තමේන්තු ගෙවීම්)
ගණකාධිකාරී (ප්‍රසම්පාදන)
ගණකාධිකාරී (ආයක මුදල්)
ගණකාධිකාරී (මාසික ගෙවීම්)
ගණකාධිකාරී (පාරිතෝෂික)
ගණකාධිකාරී (වැඩිපුර ගෙවීම් ආපසු අයකර ගැනීම)
ගණකාධිකාරී (විෂමතා)
ප්‍රධාන අභ්‍යන්තර විගණක
අභ්‍යන්තර විගණක
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
වෛද්‍ය උපදේශක
අධ්‍යක්ෂ (ඩිජිටල් පරිපාලන හා සේවා)
සහකාර/නියෝජ්‍ය අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ) SLAS
සහකාර/නියෝජ්‍ය අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ) SLITS
අධ්‍යක්ෂ (ප්‍රතිපත්ති හා නිර්දේශන)
සහකාර/නියෝජ්‍ය අධ්‍යක්ෂ (ප්‍රතිපත්ති)
නීති නිලධාරී
අධ්‍යක්ෂ (වැ.අ.වි.වැ.)
සහකාර/නියෝජ්‍ය අධ්‍යක්ෂ (වැ.අ.වි.වැ. )
සහකාර/නියෝජ්‍ය අධ්‍යක්ෂ (වැ.අ.වි.වැ. 11)
අධ්‍යක්ෂ (විශ්‍රාම වැටුප්)
සහකාර/නියෝජ්‍ය අධ්‍යක්ෂ (විමධ්‍යගත)
සහකාර/නියෝජ්‍ය අධ්‍යක්ෂ (මධ්‍යගත)
සහකාර/නියෝජ්‍ය අධ්‍යක්ෂ (සන්නද්ධ සේවා)
සහකාර/නියෝජ්‍ය අධ්‍යක්ෂ (විදේශ විශ්‍රාම වැටුප්)
අධ්‍යක්ෂ (පාලන)
සහකාර/නියෝජ්‍ය අධ්‍යක්ෂ (මානව සම්පත්)
සහකාර/නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන)
ප්‍ර.ක.සේ.නි (මා.ස.)
ප්‍ර.ක.සේ.නි (පාලන)
ශාඛා ප්‍රධානී (තැපැල්)
ශාඛා ප්‍රධානී (පාලන)
සාමා පරිවර්තක

## විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ අනුමත කාර්යය මණ්ඩලය- 2024.12.31 දිනට

| තනතුරේ ස්වභාවය | තනතුර | අදාළ වන සේවය | වැටුප් ක්‍රමය | අනුමත මුළු තනතුරු සංඛ්‍යාව | සේවයේ නියුතු සංඛ්‍යාව | පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් | SLAS (Special) | SL-3-2016 | 1 | 1 | 0 |
| | අතිරේක විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් | SLAS (Special) | SL-3-2016 | 1 | 1 | 0 |
| | වෛද්‍ය නිලධාරී (කොන්ත්‍රාත් පදනම) | Primary Grade | SL-2-2016 | 1 | 0 | 1 |
| | විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ | SLAS (Class I) | SL-1-2016 | 5 | 5 | 0 |
| | ප්‍රධාන ගණකාධිකාරී | SLAcS(Class I) | SL-1-2016 | 1 | 0 | 1 |
| | ප්‍රධාන අභ්‍යන්තර විගණක | SLAcS(Class I) | SL-1-2016 | 1 | 0 | 1 |
| | නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ | SLAS(Class II or III) | SL-1-2016 | 10 | 9 | 1 |
| | ගණකාධිකාරී | SLAcS(Class I) | SL-1-2016 | 1 | 1 | 0 |
| | ගණකාධිකාරී | SLAcS(Class II or III) | SL-1-2016 | 9 | 8 | 1 |
| | නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ | SLITS(Class II or III) | SL-1-2016 | 1 | 1 | 0 |
| | නීති නිලධාරී | Dept | SL-1-2016 | 1 | 1 | 0 |
| | පරිගණක මෘදුකාංග සංවර්ධක (කොන්ත්‍රාත් පදනම) | Dept | | 3 | 0 | 3 |
| | | | | **35** | **27** | **08** |
| තෘතීය මට්ටම | පරිපාලන නිලධාරී | PMAS (Supra) | MN-7-2016 | 4 | 3 | 1 |
| | භාෂා පරිවර්තක<br>සිංහල -ඉංග්‍රීසි - 01<br>සිංහල - දෙමළ - 01 | TS | MN-6-2016 | 2 | 2 | 0 |
| | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී | SLICTS | MN-6-2016 | 5 | 5 | 0 |
| | | | | **11** | **10** | **01** |
| ද්විතීය මට්ටම | කාර්මික නිලධාරී | SLTS | MN-3-2016 | 1 | 0 | 1 |
| | අයවැය සහකාර | RS | MN-4-2016 | 1 | 0 | 1 |
| | විශ්‍රාම වැටුප් නිලධාරී | Dept. | MN-4-2016 | 186 | 174 | 12* |
| | සංවර්ධන නිලධාරී | DOS | MN-4-2016 | 598 | 585 | 13 |
| | කළමනාකරණ සේවා නිලධාරී | MSO | MN-2-2016 | 190 | 149 | 41 |
| | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | SLICTS | MT-1-2016 | 5 | 5 | 0 |
| | ලේඛණ සහකාර | Dept. | MN-1-2016 | 119 | 117 | 02* |
| | Help Desk Operator | Dept. | | 2 | 0 | 2 |
| | | | | **1,102** | **1,030** | **72** |
| ප්‍රාථමික මට්ටම | බංගලා භාරකරු | Dept. | PL-1-2016 | 2 | 1 | 1 |
| | අරක්කැමි / උද්‍යාන කම්කරු | Dept. | PL-2-2016 | 4 | 2 | 2 |
| | රියදුරු | DS | PL-3-2016 | 12 | 12 | 0 |
| | විදුලි කාර්මික | Dept. | PL-3-2016 | 1 | 0 | 1 |
| | කාර්යාල කාර්ය සහායක | OES | PL-1-2016 | 78 | 61 | 17 |
| | | | | **97** | **76** | **21** |
| **එකතුව** | | | | **1,245** | **1,143** | **102** |

* විශ්‍රාම වැටුප් නිලධාරීන් සහ ලේඛන සහකාර නිලධාරීන් නැවත බඳවා ගැනීම සිදු නොකරයි.

## 1.5. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

1. අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය
2. අතිරේක අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය
3. අධ්‍යක්ෂ(විශ්‍රාම වැටුප්) කාර්යාලය
4. පාලන අංශය
5. විමධ්‍යගත විශ්‍රාම වැටුප් අංශය
6. මධ්‍යගත විශ්‍රාම වැටුප් අංශය
7. සත්කාර පියස
8. ප්‍රතිපත්ති හා විමර්ශන අංශය
9. සන්නද්ධ සේවා විශ්‍රාම වැටුප් අංශය
10. විදේශ විශ්‍රාම වැටුප් අංශය
11. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අංශය
12. ගෙවීම් අංශය
13. මාසික ගෙවීම් අංශය
14. පාරිතෝෂික ගෙවීම් අංශය
15. විෂමතා අංශය
16. වැන්දඹු අනත්දරු දායක මුදල් කළමනාකරණ අංශය
17. සැපයුම් අංශය
18. වැඩිපුර ගෙවීම් අයකිරීම් අංශය
19. රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල
20. නීති අංශය
21. අභ්‍යන්තර විගණන අංශය
22. තොරතුරු තාක්ෂණ අංශය
23. මාධ්‍ය අංශය
24. තැපැල් අංශය
25. 1970 - ක්ෂණික දුරකථන ඇමතුම් අංශය

## 02.
## ප්‍රගතිය හා ඉදිරි දැක්ම

### විශේෂ ව්‍යාපෘති

- **පාරිතෝෂික ගෙවීම් කාර්යක්ෂම කිරීම**

2024 මාර්තු දක්වා පාරිතෝෂික ගෙවීම් චෙක්පත් මගින් සිදු වූ නමුත් මේ වන විට ස්ලිප් ක්‍රමය (Slip method) හරහා ගෙවීම් කිරීම ආරම්භ කොට ඇති බැවින් විශ්‍රාමිකයින්ට ප්‍රමාදයකින් තොරව තම ප්‍රතිලාභ අත්කර ගැනීමට පහසුකම් සලසා ඇති අතර මේ වන විට විශ්‍රාම වැටුප් ආරම්භ කළ මාසයේදීම පාරිතෝෂික ගෙවීම් සිදු කරනු ලැබේ. ඒ අනුව 2024 දෙසැම්බර් 31 වන විට විශ්‍රාමිකයින් 40,926 ක් සඳහා පාරිතෝෂික ගෙවීම් සිදු කර ඇත.

- **වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප සඳහා හිඟ දායක මුදල් අයකිරීමේ දී ඊට අදාල පොළිය අය කළ යුතු ආකාරය පිළිබඳ උපදෙස් ලබාදීම.**

හිඟ වැන්දඹු අනත්දරු දායක මුදල් ගෙවීමේ දී අය කරනු ලබන පොළී ප්‍රතිශතය හා පොළී ක්‍රමය පිළිබඳ මතු වී තිබූ ගැටළු සහගත තත්ත්වය නිරාකරණය කිරීම සඳහා ගරු නීතිපතිතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් විසින් ලබා දෙන ලද උපදෙස් හා මඟපෙන්වීම අනුව 2024.04.02 දිනැතිව විශ්‍රාම වැටුප් උපදෙස් ලිපි අංක 01/2024 නිකුත් කර ඇත.

- **ත්‍රිවිධ හමුදා හා පොලිස් නිලධාරීන් සඳහා රු.5000.00 ක මාසික දීමනාව ගෙවීම**

2024.08.06 දිනැති විශ්‍රාම වැටුප් උපදෙස් ලිපි අංක 06/2024 මගින් ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් දුබලතාවයට පත්ව ඇති ත්‍රිවිධ හමුදා හා පොලිස් නිලධාරීන් වෙත ද මිය ගොස් ඇති එම නිලධාරීන්ගේ යැපෙන්නන් වෙත ද වයස අවුරුදු 55 දක්වා වන්දි වැටුප් හා දීමනා ගෙවීමේදී ඊට අදාලව රු.5000.00 ක මාසික දීමනාව හිමිගැන්වීම ත්‍රිවිධ හමුදාව හා පොලිසිය යන ආයතන වෙත පවරා ඇත.

- **වැන්දඹු අනත්දරු ගෙවීම් කාර්යක්ෂම කිරීම**

2024.08.01 දිනැති විශ්‍රාම වැටුප් උපදෙස් ලිපි අංක 05/2024 මගින් විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 03/2020 හි විධිවිධාන ප්‍රකාරව මාර්ගගත දත්ත පද්ධතිය හරහා යොමු කළ නොහැකි වැන්දඹු/ වැන්දඹු පුරුෂ/ අනත්දරු/ ආබාධිත අනත්දරු විශ්‍රාම වැටුප් අයදුම්පත්‍ර DS Portal දත්ත පද්ධතිය මගින් ඇතුළත් කිරීමට අවස්ථාව ලබාදීම තුලින් වැන්දඹු අනත්දරු ගෙවීම් කාර්යක්ෂම කිරීම සඳහා කටයුතු කර ඇත.

- **වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු ක්‍රමයේ ලියාපදිංචිය**

2024 දෙසැම්බර් 31 දින වන විට වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු ක්‍රමයේ ලියාපදිංචිය සඳහා ලැබී ඇති අයදුම්පත් වලින් 36,652 ක් සඳහා සාමාජික අංක නිකුත් කර ඇත.

- **රු.3000/-ක විශේෂ අන්තර්කාලීන මාසික දීමනාවක් හිමිගැන්වීම**

අංක අමප/24/1453/601/090 හා 2024.07.24 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය හා අංක අමප/20/1608/605/058 සහ 2024.08.12 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව රාජ්‍ය සේවයේ

යෙදී විශ්‍රාම ගොස් ඇති සියලුම විශ්‍රාමිකයින් වෙත 2024 ඔක්තෝබර් මස සිට රු.3000/-ක විශේෂ අන්තර්කාලීන මාසික දීමනාවක් හිමිගැන්වීමට කටයුතු කර ඇත.

- **දත්ත පද්ධතීන් වැඩිදියුණු කිරීම**

- හමුදා විශ්‍රාම වැටුප් සඳහා සංශෝධනයන් සිදු කළ යුතු වන අවස්ථාවන්හි දී එය වඩාත් නිරවද්‍ය හා කාර්යක්ෂම ආකාරයෙන් සිදු කළ හැකි වන පරිදි හමුදා විශ්‍රාම වැටුප් සංශෝධනය සඳහා මාර්ගගත තොරතුරු පද්ධතියක් (PD 6 Forces) සකස් කිරීම.

- රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022 අනුව දේශීය හා විදේශීය නිවාඩු ලබා ගන්නා ලද රාජ්‍ය නිලධාරින්ගේ වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් දායක මුදල් සඳහා වන මාසික හෝ ත්‍රෛමාසික ප්‍රේෂණයන් තත්කාලීනව යාවත්කාලීන වන පරිදි වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ප්‍රේෂණ කළමනාකරණ පද්ධතිය වැඩි දියුණු කිරීම. මෙය මාර්ගගත තොරතුරු පද්ධතියක් හරහා මහජන බැංකුවේ දත්ත පද්ධතීන් සමඟ තාක්ෂණිකව සම්බන්ධවීම මඟින් සිදු කරනු ලබන අතර එම තොරතුරු පද්ධතිය නිවාඩු ලබා ගන්නා නිලධාරින්ට වඩාත් පහසු වන ආකාරයෙන් නිවාඩුවක් අවසන් කිරීමට, නිවාඩුවක් දීර්ඝ කිරීමට හා නව නිවාඩුවක් ඇතුළත් කිරීමට හැකිවන ආකාරයේ නව සංස්කරණයක් සිදු කර ඇත.

- විශ්‍රාමිකයින්ට නිදහස් දුම්රිය බලපත්‍ර ලබා ගැනීම සහ දුම්රිය මගී ආසන වෙන් කිරීම සඳහා මාර්ගගත පද්ධතියක් 2025 වර්ෂයේ මුල් මාසය තුළ හඳුන්වා දීමට නියමිතය. එමගින් ස්වයංක්‍රීයව දත්ත පරීක්ෂාව යටතේ නිවැරදි ප්‍රතිලාභීන් හඳුනාගැනීමටත්, විශ්‍රාමික නිදහස් දුම්රිය බලපත්‍ර සඳහා ගෙවීම් ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීමට හා ගමන් බලපත්‍ර මුද්‍රණය සඳහා වන රාජ්‍ය පිරිවැය අවම කිරීමත් සඳහා පහසුකම් සලසා ඇති අතර 2024.12.31 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 02/2024 මගින් මෙම ක්‍රමවේදයට අදාලව උපදෙස් නිකුත් කර ඇත.

- රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව සමඟ ඒකාබද්ධව විශ්‍රාමික මරණ කාර්යක්ෂමව දැන ගැනීම සඳහා තොරතුරු පද්ධතියක් සකස් කර ඇති අතර 2025 වර්ෂයේ එම පද්ධතිය මුදා හැරීමට නියමිතය.

- රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලෙහි දායක මුදල් ලැබීම සහ ප්‍රතිලාභ හිමිගැන්වීම චෙක්පත් භාවිතයෙන් සිදුවන අතර එය ලංකා බැංකුවේ තොරතුරු තාක්ෂණ ඒකකය සමඟ ඒකාබද්ධ වෙමින් Online reconciliation හරහා මාර්ගගතව ප්‍රේෂණ ලබා ගැනීමටත්, එහි වාර්තා තබා ගැනීමටත් හැකි වන පරිදි රාජ්‍ය සේවක අර්ථසාධක අරමුදල් (PSPF) ක්‍රියාවලිය ප්‍රතිනිර්මාණය (Re-engineer) කර ඇති අතර 2025 වර්ෂයේ ජනවාරි මස එම පද්ධතිය මුදා හැරීමට නියමිතය.

- වැන්දඹු හා අනත්දරු ක්‍රමයෙහි ලියාපදිංචි කිරීමේ තොරතුරු පද්ධතිය සියළුම රාජ්‍ය නිලධාරීන්ගේ සහ ඔවුන්ගේ යැපෙන්නන්ගේ තොරතුරු ඇතුළත් වන පරිදි සකස් කර ඇති අතර මෙම තොරතුරු පද්ධතිය දැනට පවතින ලියාපදිංචි තොරතුරු පද්ධතියෙහි දත්ත හා ඊට අමතර දත්ත ද ඇතුළත් කර ඉදිරියේදී විශ්‍රාමික ප්‍රතිලාභ පැතිකඩක් (Pension beneficiary profile) ලෙස අතථ්‍ය (Virtual file) ගොනුවක් නිර්මාණය කළ හැකි වන පරිදි සකස් කරමින් පවතී. මෙම තොරතුරු පද්ධතිය මඟින් රාජ්‍ය නිලධාරීන් සහ ඔවුන්ගේ වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ප්‍රතිලාභීන්ගේ අනන්‍යතාව සත්‍යාපනය කර ගත හැකි ආකාරයට QR කේතයක් සහිත හැඳුනුම්පතක් නිකුත් කිරීමට නියමිතය.

- **දෙපාර්තමේන්තු නිල වෙබ් අඩවිය වැඩි දියුණු කිරීම**

විශ්‍රාමිකයින්ට තම ජාතික හැඳුනුම්පත් අංකය භාවිතයෙන් තමා අපේක්ෂා කරන විශ්‍රාම වැටුප් සේවාවෙහි වර්තමාන තත්ත්වය ත්‍රෛභාෂාවෙන්ම පරීක්ෂා කළ හැකි පරිදි වෙබ් අඩවිය නව්‍යකරණය කර ඇති අතර 2025 වර්ෂයේ ජනවාරි මස එළිදැක්වීමට නියමිතය.

■ **පුහුණු වැඩසටහන් පැවැත්වීම.**

- විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ විශ්‍රාම වැටුප් කළමනාකරණ දත්ත පද්ධතිය හා සම්බන්ධව රාජකාරී කටයුතු සිදු කරන විවිධ රාජ්‍ය ආයතනයන්හි විෂය නිලධාරීන් හා දෙපාර්තමේන්තුවට අනුයුක්තව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි සේවය කරන නිලධාරීන් සඳහා මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ ද දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ හා ද්විතීය මට්ටමේ නිලධාරීන් සඳහා දෙපාර්තමේන්තු පරිශ්‍රයේ පුහුණු වැඩසටහන් පැවැත්වීමට කටයුතු කර ඇති අතර මේ වන විට අභ්‍යන්තර පුහුණු වැඩසටහන් 28 ක් මගින් 4,500 කට ආසන්න නිලධාරීන් පිරිසක් සඳහා පුහුණුවීම් සිදු කිරීම.
- එමෙන්ම විෂයය අවශ්‍යතාවය අනුව වෙනත් රාජ්‍ය ආයතන මගින් පවත්වනු ලැබූ පුහුණු වැඩසටහන් 19ක් සඳහා නිලධාරීන් හට සම්බන්ධවීමට අවස්ථාව ලබාදී ඇති අතර විවිධ රාජ්‍ය ආයතන මගින් පවත්වනු ලැබූ පුහුණු වැඩසටහන් 24ක් සඳහා සම්පත්දායකත්වය ලබාදීම සිදු කිරීම.

තවද 2024.06.05 දින දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකාවක් සඳහා පැමිණි ත්‍රිකුණාමලය නාවික හා සාගරික විද්‍යා පීඨයේ නිලධාරීන් කණ්ඩායම සඳහා සාමාන්‍ය විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රියාවලිය, ත්‍රිවිධ හමුදාවන්ට අයත් නිලධරයන්ගේ සහ ඔවුන්ගේ යැපෙන්නන්ට විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ හිමිගැන්වීම, වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රියාවලිය සම්බන්ධයෙන් දැනුවත් කිරීමට වැඩසටහනක් මෙහෙයවීම.







**නාවික හා සාගරික විද්‍යා පීඨයේ නිලධාරීන් කණ්ඩායම සඳහා පැවැත්වූ පුහුණු වැඩසටහනේ අවස්ථා**

■ **ජාතික විශ්‍රාමික දිනය සැමරීම**

ඔක්තෝබර් 08 දිනට යෙදෙන ජාතික විශ්‍රාමික දිනය වෙනුවෙන්, විශ්‍රාමික ප්‍රජාවට ලබාදෙන සේවාවන් සම්බන්ධයෙන් දැනුවත් කිරීමක් සිදුකරමින් ජාතික පුවත්පත් ත්‍රිත්වයක ඇතුළු පිටු කිහිපයක පුවත්පත් අතිරේකයක් පළ කරන ලදී.

## 2024 වර්ෂයේ නිකුත් කර ඇති චක්‍රලේඛ

| | නිකුත් කළ දිනය | චක්‍රලේඛ අංකය | කාරණය |
|---|---|---|---|
| 01 | 2024.11.12 | 01/2024 | 2025 වර්ෂයේ විශ්‍රාම වැටුප් ගෙවීම |
| 02 | 2024.12.31 | 02/2024 | විශ්‍රාමිකයින්ට නිදහස් දුම්රිය ගමන් බලපත්‍ර ලබා ගැනීම හා දුම්රිය මගී ආසන වෙන් කිරීම මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ සිදු කිරීම |
| 03 | 2024.12.31 | 03/2024 | රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ක්‍රමය යටතේ සාමාජිකයින් ලියාපදිංචිය, දායක මුදල් යොමු කිරීම සහ හිමිකම් ලබා ගැනීම මාර්ගගත පද්ධතියක් හරහා සිදු කිරීම |

## 2024 වර්ෂයේ නිකුත් කර ඇති උපදෙස් ලිපි

| | නිකුත් කළ දිනය | උපදෙස් ලිපි අංකය | කාරණය |
|---|---|---|---|
| 01 | 2024.01.08 | 07/2023 (I) | විශ්‍රාමික ජීවිත සහතිකය - 2024 |
| 02 | 2024.03.21 | 02/2020 (II) | විශ්‍රාමිකයන්ගේ තොරතුරු පිටතට ලබා නොදීම |
| 03 | 2024.04.02 | 01/2024 | වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප සඳහා හිඟ දායක මුදල් අයකිරීමේ දී ඊට අදාළව පොළිය අය කළ යුතු ආකාරය |
| 04 | 2024.05.29 | 02/2024 | විශ්‍රාමිකයින් විසින් මොබිටෙල් සහ ඩයලොග් පුද්ගලික සමාගම් වෙතින් මිල දී ගනු ලබන ජංගම දුරකතන හා සිම්පත් වලට අදාළ ගෙවීම් ඔවුන්ගේ මාසික විශ්‍රාම වැටුපෙන් අඩුකිරීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රමවේදය |
| 05 | 2024.06.14 | 07/2023 (II) | විශ්‍රාමික ජීවිත සහතිකය - 2024 |
| 06 | 2024.07.30 | 03/2024 | ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ සංඛ්‍යාලේඛන විමර්ශක තනතුරෙහි සේවය කර 2000.10.04 දිනට පෙර විශ්‍රාම ගන්වන ලද නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 16/2015 හා 14/2019 අනුව සංශෝධනය කිරීම |
| 07 | 2024.08.01 | 04/2024 | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් හිමිගැන්වීම සඳහා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ලිපිගොනු ඉදිරිපත් කිරීම විධිමත් කිරීම |
| 08 | 2024.08.01 | 05/2024 | විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 03/2020 හි විධිවිධාන ප්‍රකාරව මාර්ගගත දත්ත පද්ධතිය ඔස්සේ යොමු කළ නොහැකි වැන්දඹු / වැන්දඹු පුරුෂ / අනත්දරු / ආබාධිත අනත්දරු විශ්‍රාම වැටුප් අයදුම්පත්‍ර DS Portal දත්ත පද්ධතිය ඔස්සේ ඉදිරිපත් කිරීම |
| 09 | 2024.08.06 | 06/2024 | ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් දුබලතාවයට පත්ව ඇති ත්‍රිවිධ හමුදා හා පොලිස් නිලධාරීන් වෙත ද මිය ගොස් ඇති එම නිලධාරීන්ගේ යැපෙන්නන් වෙත වයස අවු. 55 දක්වා වන්දි වැටුප් හා දීමනා ගෙවීමේ දී ඊට අදාළව රු.5000.00 ක මාසික දීමනාව හිමිගැන්වීම |

| | | | |
|---|---|---|---|
| 10 | 2024.10.04 | 07/2024 | වෙනත් නීතිය ක්‍රියාත්මක කිරීමේ රාජකාරී කටයුතුවල සේවයේ යෙදී සිටිය දී මියගිය පොලිස් නිලධරයන්ගේ යැපෙන්නන් වෙත හා ආබාධිතව සේවයෙන් ඉවත් වූ පොලිස් නිලධරයන් වෙත වයස අවු.55 දක්වා වැටුප් හා දීමනා ගෙවීම |
| 11 | 2024.10.10 | 01/2024 (I) | වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප සඳහා හිඟ දායක මුදල අදාළ වන කාලසීමාව අනුව 4% සුළු පොළිය ගණනය කළ යුතු ආකාරය |
| 12 | 2024.11.07 | 08/2024 | ආබාධිත අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම |
| 13 | 2024.12.09 | 09/2024 | ත්‍රිවිධ හමුදාවන්හි සේවයේ නියුතු සියලුම ශ්‍රේණි වෛද්‍ය නිලධාරීන්, සියලුම දන්ත වෛද්‍ය නිලධාරීන් සහ සියලුම විශේෂඥ වෛද්‍ය නිලධාරීන් විශ්‍රාම ගැන්විය යුතු විධිවිධාන පිළිබඳව දැනුම්වත් කිරීම |
| 14 | 2024.12.19 | 10/2024 | විශ්‍රාමික ජීවිත සහතිකය - 2025 |

- **විශ්‍රාම වැටුප් ගෙවීම්**

  - **මාසිකව ගෙවීම් කරන ලද සිවිල්, හමුදා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් සංඛ්‍යාව**

| මාසය | සිවිල් | | වැ.අ.වි.වැ. | | හමුදා | | මුළු විශ්‍රාමිකයින් ගණන | මුළු මුදල (රු) |
|---|---|---|---|---|---|---|---|---|
| | විශ්‍රාමිකයින් ගණන | මුදල (රු) | විශ්‍රාමිකයින් ගණන | මුදල (රු) | විශ්‍රාමිකයින් ගණන | මුදල (රු) | | |
| ජනවාරි | 384,857 | 14,985,438,137 | 187,689 | 5,262,463,835 | 131,924 | 6,027,146,328 | 704,470 | 26,275,048,299 |
| පෙබරවාරි | 386,744 | 15,515,588,603 | 187,852 | 5,299,761,141 | 132,746 | 6,176,732,335 | 707,342 | 26,992,082,079 |
| මාර්තු | 387,909 | 15,344,285,186 | 188,062 | 5,366,163,008 | 133,261 | 6,162,290,818 | 709,232 | 26,872,739,013 |
| අප්‍රේල් | 389,421 | 16,457,882,833 | 188,419 | 5,685,874,554 | 134,175 | 6,584,894,985 | 712,015 | 28,728,652,372 |
| මැයි | 389,021 | 16,103,722,231 | 188,093 | 5,553,585,049 | 134,397 | 6,448,630,142 | 711,511 | 28,105,937,421 |
| ජුනි | 389,870 | 16,521,402,629 | 188,095 | 5,604,159,766 | 134,822 | 6,600,037,172 | 712,787 | 28,725,599,567 |
| ජූලි | 389,307 | 16,576,044,061 | 186,715 | 5,679,519,108 | 134,693 | 6,625,221,701 | 710,715 | 28,880,784,870 |
| අගෝස්තු | 390,969 | 16,722,085,036 | 187,366 | 5,669,878,286 | 135,485 | 6,665,345,499 | 713,820 | 29,057,308,820 |
| සැප්තැම්බර් | 392,966 | 17,013,185,129 | 187,913 | 6,183,807,294 | 136,468 | 6,796,146,497 | 717,347 | 29,993,138,920 |
| ඔක්තෝබර් | 394,183 | 17,989,222,140 | 188,233 | 6,218,097,078 | 137,193 | 7,201,405,440 | 719,609 | 31,408,724,657 |
| නොවැම්බර් | 395,177 | 18,115,786,892 | 188,537 | 6,186,676,578 | 137,737 | 7,272,063,317 | 721,451 | 31,574,526,787 |
| දෙසැම්බර් | 397,182 | 18,493,979,335 | 189,509 | 6,456,073,019 | 138,591 | 7,368,376,229 | 725,282 | 32,318,428,583 |
| **එකතුව** | | **199,838,622,211** | | **69,166,058,717** | | **79,928,290,463** | | **348,932,971,390** |

  - **වාර්ෂික විශ්‍රාම වැටුප් වියදම**

| වර්ෂය | වියදම (රු,000) |
|---|---|
| 2020 | 257,833,481 |
| 2021 | 269,827,125 |
| 2022 | 309,066,783 |
| 2023 | 372,364,441 |
| 2024 | 395,720,004 |

- සක්‍රීය කරන ලද නව විශ්‍රාමිකයින් සංඛ්‍යාව (ජනවාරි- දෙසැම්බර්)

| මාසය | සිවිල් | | වැ.අ.වි.වැ. | | හමුදා | | මුළු විශ්‍රාමිකයින් ගණන | මුළු මුදල (රු) |
|---|---|---|---|---|---|---|---|---|
| | විශ්‍රාමිකයින් ගණන | මුදල (රු) | විශ්‍රාමිකයින් ගණන | මුදල (රු) | විශ්‍රාමිකයින් ගණන | මුදල (රු) | | |
| ජනවාරි | 793 | 186,953,399 | 583 | 185,754,605 | 309 | 61,397,149 | 1,685 | 434,105,153 |
| පෙබරවාරි | 2,994 | 881,382,263 | 872 | 234,329,842 | 898 | 209,679,299 | 4,764 | 1,325,391,404 |
| මාර්තු | 2,048 | 586,079,387 | 877 | 247,826,529 | 591 | 144,751,487 | 3,516 | 978,657,402 |
| අප්‍රේල් | 2,335 | 651,802,944 | 1,065 | 265,309,311 | 930 | 234,038,797 | 4,330 | 1,151,151,052 |
| මැයි | 888 | 253,774,071 | 517 | 142,466,536 | 343 | 91,185,753 | 1,748 | 487,426,360 |
| ජූනි | 2,035 | 641,039,572 | 801 | 190,018,757 | 596 | 169,570,262 | 3,432 | 1,000,628,591 |
| ජූලි | 2,356 | 685,605,289 | 979 | 281,495,898 | 825 | 230,233,706 | 4,160 | 1,197,334,893 |
| අගෝස්තු | 2,250 | 704,435,285 | 909 | 222,503,758 | 751 | 178,516,648 | 3,910 | 1,105,455,691 |
| සැප්තැම්බර් | 2,638 | 794,714,971 | 889 | 275,470,740 | 868 | 212,926,079 | 4,395 | 1,283,111,789 |
| ඔක්තෝබර් | 1,962 | 574,789,401 | 808 | 242,389,479 | 712 | 168,012,808 | 3,482 | 985,191,687 |
| නොවැම්බර් | 1,859 | 593,464,032 | 838 | 202,090,918 | 554 | 154,717,049 | 3,251 | 950,271,999 |
| දෙසැම්බර් | 2,821 | 892,900,210 | 1,531 | 412,777,336 | 910 | 209,987,919 | 5,262 | 1,515,665,465 |
| **එකතුව** | **24,979** | **7,446,940,823** | **10,669** | **2,902,433,709** | **8,287** | **2,065,016,954** | **43,935** | **12,414,391,485** |

- දිස්ත්‍රික් පදනමින් විශ්‍රාමිකයින් සංඛ්‍යාව සහ වියදම - 2024 දෙසැම්බර්

| දිස්ත්‍රික්කය | විශ්‍රාමිකයින් ගණන | මුදල (රු) | අඩු කිරීම් | මුදල (රු) |
|---|---|---|---|---|
| ගම්පහ | 91,304 | 3,982,168,799 | 51,869,518 | 3,930,299,281 |
| කොළඹ | 90,290 | 4,083,323,796 | 44,196,703 | 4,039,127,093 |
| කුරුණෑගල | 71,183 | 3,236,031,370 | 31,410,586 | 3,204,620,783 |
| මහනුවර | 63,349 | 2,869,310,113 | 37,088,419 | 2,832,221,693 |
| කළුතර | 46,735 | 2,032,193,021 | 26,108,226 | 2,006,084,795 |
| අනුරාධපුරය | 41,939 | 1,909,009,731 | 37,655,131 | 1,871,354,600 |
| ගාල්ල | 40,729 | 1,815,038,826 | 23,655,213 | 1,791,383,613 |
| කෑගල්ල | 35,149 | 1,575,156,753 | 21,557,139 | 1,553,599,614 |
| බදුල්ල | 30,221 | 1,346,997,975 | 23,700,300 | 1,323,297,674 |
| මාතර | 29,686 | 1,318,620,435 | 15,976,609 | 1,302,643,826 |
| රත්නපුර | 25,122 | 1,108,552,882 | 14,748,103 | 1,093,804,779 |
| මාතලේ | 19,682 | 874,963,088 | 12,881,644 | 862,081,444 |
| හම්බන්තොට | 18,534 | 822,995,930 | 11,696,271 | 811,299,659 |
| පුත්තලම | 16,550 | 727,849,835 | 9,157,973 | 718,691,862 |
| අම්පාර | 15,656 | 733,238,680 | 10,868,778 | 722,369,902 |
| යාපනය | 15,541 | 684,521,518 | 3,482,699 | 681,038,819 |
| මොණරාගල | 13,388 | 576,498,429 | 8,293,741 | 568,204,688 |
| පොළොන්නරුව | 12,985 | 567,041,864 | 7,062,375 | 559,979,489 |
| නුවරඑළිය | 12,383 | 535,326,021 | 6,617,013 | 528,709,008 |
| මඩකලපුව | 9,456 | 442,528,639 | 4,259,475 | 438,269,165 |
| ත්‍රිකුණාමලය | 9,403 | 420,875,045 | 4,783,205 | 416,091,840 |
| විදේශගත | 8,201 | 296,785,190 | 1,254,881 | 295,530,309 |
| වව්නියාව | 3,312 | 157,414,700 | 1,884,761 | 155,529,939 |
| මන්නාරම | 1,814 | 81,965,449 | 3,438,699 | 78,526,750 |
| කිලිනොච්චි | 1,361 | 58,835,253 | 474,053 | 58,361,200 |
| මුලතිව් | 1,309 | 61,185,241 | 305,406 | 60,879,835 |
| **එකතුව** | **725,282** | **32,318,428,583** | **414,426,922** | **31,904,001,660** |

- පාරිතෝෂික ගෙවීම් (ජනවාරි- දෙසැම්බර්)

| මාසය | විශ්‍රාමිකයින් සංඛ්‍යාව | මුදල (රු) * |
|---|---|---|
| ජනවාරි | 3,155 | 3,937,198,930 |
| පෙබරවාරි | 2,938 | 3,278,639,559 |
| මාර්තු | 3,263 | 3,666,209,305 |
| අප්‍රේල් | 3,716 | 4,144,107,062 |
| මැයි | 3,567 | 3,717,688,053 |
| ජුනි | 2,957 | 3,600,545,253 |
| ජුලි | 3,474 | 4,105,179,144 |
| අගෝස්තු | 3,722 | 3,978,596,650 |
| සැප්තැම්බර් | 2,408 | 2,677,718,573 |
| ඔක්තෝබර් | 4,702 | 5,659,541,530 |
| නොවැම්බර් | 3,097 | 3,530,316,244 |
| දෙසැම්බර් | 3,927 | 4,154,230,796 |
| **එකතුව** | **40,926** | **46,449,971,099** |

* මුදා හරින ලද ප්‍රතිපාදන

- අග්‍රහාර රක්ෂණ අරමුදලට අයකිරීම් (ජනවාරි- දෙසැම්බර්)

| මාසය | මුළු විශ්‍රාමිකයින් ගණන | මුළු මුදල (රු) |
|---|---|---|
| ජනවාරි | 141,322 | 28,751,800 |
| පෙබරවාරි | 144,149 | 31,871,800 |
| මාර්තු | 146,051 | 31,210,000 |
| අප්‍රේල් | 148,225 | 32,067,400 |
| මැයි | 148,928 | 30,580,200 |
| ජුනි | 150,778 | 32,255,000 |
| ජුලි | 152,704 | 32,943,600 |
| අගෝස්තු | 154,857 | 33,321,800 |
| සැප්තැම්බර් | 157,362 | 34,448,000 |
| ඔක්තෝබර් | 159,207 | 33,802,800 |
| නොවැම්බර් | 160,888 | 34,250,800 |
| දෙසැම්බර් | 163,570 | 35,637,200 |
| **එකතුව** | **-** | **391,140,400** |

## ප්‍රගතිය හා ඉදිරි දැක්ම

- රු.5000ක මාසික දීමනාව ගෙවන ලද විශ්‍රාමිකයින් සංඛ්‍යාව (ජනවාරි- දෙසැම්බර්)

| මාසය | විශ්‍රාමිකයින් ගණන | මුළු මුදල (රු) |
|---|---|---|
| ජනවාරි | 604,097 | 3,016,229,149 |
| පෙබරවාරි | 606,394 | 3,027,732,541 |
| මාර්තු | 607,769 | 3,034,494,423 |
| අප්‍රේල් | 609,919 | 3,045,206,428 |
| මැයි | 609,688 | 3,044,049,375 |
| ජූනි | 610,682 | 3,049,005,249 |
| ජූලි | 610,523 | 3,048,309,362 |
| අගෝස්තු | 613,478 | 3,063,057,394 |
| සැප්තැම්බර් | 616,879 | 3,080,033,411 |
| ඔක්තෝබර් | 619,040 | 3,090,837,296 |
| නොවැම්බර් | 620,858 | 3,099,888,111 |
| දෙසැම්බර් | 624,595 | 3,118,514,173 |
| **එකතුව** | **-** | **36,717,356,913** |

- රු.3000.00 ක විශේෂ අන්තර්කාලීන දීමනාව ගෙවීම

| මාසය | විශ්‍රාමිකයින් ගණන | මුළු මුදල (රු) |
|---|---|---|
| ඔක්තෝබර් | 679,960 | 2,021,163,071 |
| නොවැම්බර් | 681,822 | 2,026,770,161 |
| දෙසැම්බර් | 685,155 | 2,038,969,169 |
| **එකතුව** | **-** | **6,086,902,401** |

- විශ්‍රාම වැටුප් විෂමතා සහ සංශෝධන (ජනවාරි- දෙසැම්බර්)

| මාසය | සංඛ්‍යාව | ගෙවූ මුදල (රු.මිලියන) |
|---|---|---|
| ජනවාරි | 1023 | 134 |
| පෙබරවාරි | 879 | 116 |
| මාර්තු | 859 | 122 |
| අප්‍රේල් | 875 | 123 |
| මැයි | 675 | 81 |
| ජූනි | 970 | 137 |
| ජූලි | 911 | 129 |
| අගෝස්තු | 1165 | 164 |
| සැප්තැම්බර් | 1225 | 161 |
| ඔක්තෝබර් | 960 | 134 |
| නොවැම්බර් | 1,289 | 175 |
| දෙසැම්බර් | 1,205 | 162 |
| **එකතුව** | **12,036** | **1,638** |

- **වැන්දඹු හා අනත්දරු දායක මුදල් ආපසු ගෙවීම් (ජනවාරි - දෙසැම්බර්)**

| මාසය | ගෙවූ සංඛ්‍යාව |
|---|---|
| ජනවාරි | 207 |
| පෙබරවාරි | 508 |
| මාර්තු | 165 |
| අප්‍රේල් | 238 |
| මැයි | 543 |
| ජූනි | 445 |
| ජූලි | 316 |
| අගෝස්තු | 340 |
| සැප්තැම්බර් | 377 |
| ඔක්තෝබර් | 615 |
| නොවැම්බර් | 714 |
| දෙසැම්බර් | 302 |
| **එකතුව** | **4,770** |

- **සක්‍රීය සේවයේ යෙදී සිටියදී ජීවිතක්ෂයට හෝ බෙලහීනතාවයට පත් ත්‍රිවිධ හමුදා හා පොලිස් සේවා සාමාජිකයින්ට වන්දි වැටුප් හා දීමනා ගෙවීම් - 2024 දෙසැම්බර් දක්වා**

| ආයතනය | සංඛ්‍යාව | 2024 ජනවාරි සිට දෙසැම්බර් දක්වා |
|---|---|---|
| | | ගෙවූ මුදල රු.මිලියන * |
| යුද්ධ හමුදා | 32,366 | 39,968 |
| නාවික හමුදා | 1,304 | 1,598 |
| ගුවන් හමුදා | 476 | 488 |
| පොලිස් | 1,504 | 2,192 |
| ස්ථාවර දීමනා ගෙවීම් | 3,538 | 1,320 |
| රු.5000 දීමනා ගෙවීම් | 34,645 | 1,179 |
| **එකතුව** | **39,188** | **46,745** |

* මුදා හරින ලද ප්‍රතිපාදන

**ප්‍රගතිය හා ඉදිරි දැක්ම**

- **වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ගෙවීම්**

| මාසය | වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් නව ගෙවීම් සංඛ්‍යාව | මරණ පාරිතෝෂික ගෙවීම් සංඛ්‍යාව |
|---|---|---|
| ජනවාරි | 499 | 117 |
| පෙබරවාරි | 786 | 51 |
| මාර්තු | 777 | 136 |
| අප්‍රේල් | 773 | 89 |
| මැයි | 458 | 97 |
| ජූනි | 741 | 124 |
| ජූලි | 860 | 134 |
| අගෝස්තු | 835 | 92 |
| සැප්තැම්බර් | 774 | 126 |
| ඔක්තෝබර් | 718 | 130 |
| නොවැම්බර් | 748 | 100 |
| දෙසැම්බර් | 1,439 | 191 |
| **එකතුව** | **9,408** | **1,387** |

- **සන්නද්ධ සේවා අංශයෙන් මධ්‍යම දත්ත පද්ධතියට එකතු කල විශ්‍රාම වැටුප් සහ සංශෝධන**

| විශ්‍රාම වැටුප් වර්ගය | ගෙවූ සංඛ්‍යාව (යුද්ධ/ ගුවන්/නාවික) |
|---|---|
| සේවා විශ්‍රාම වැටුප් ගෙවීම් (අවු.10/12 ට අඩු) | 100 |
| හමුදා සංශෝධන | 2,432 |
| දුබලතා සේවා විශ්‍රාම වැටුප් ගෙවීම් | 18 |
| ප්‍රතිශෝධන (අවුරුදු 55 සම්පූර්ණ) | 1,083 |
| මරණ පාරිතෝෂික | 157 |
| සේවා පාරිතෝෂික | 2,104 |
| යැපෙන්නන්ගේ දීමනා | 230 |
| දුබලතා විශ්‍රාම වැටුප | 8 |
| ස්ථාවර දීමනා | 1,477 |
| විශේෂ වන්දි | 45 |
| නැවත සේවා | 382 |
| **එකතුව** | **8,086** |

- විශ්‍රාම වැටුප් ගෙවූ විදෙස්ගත විශ්‍රාමිකයින් සංඛ්‍යාව

| මාසය | විශ්‍රාමිකයින් ගණන | ගෙවූ මුදල (රු) |
|---|---|---|
| ජනවාරි | 7,987 | 256,480,531 |
| පෙබරවාරි | 8,079 | 262,483,083 |
| මාර්තු | 8,172 | 274,663,634 |
| අප්‍රේල් | 8,341 | 300,524,694 |
| මැයි | 8,457 | 275,371,340 |
| ජුනි | 8,562 | 301,939,594 |
| ජුලි | 7,506 | 248,294,856 |
| අගෝස්තු | 7,609 | 248,719,077 |
| සැප්තැම්බර් | 7,802 | 296,505,526 |
| ඔක්තෝබර් | 7,933 | 275,012,550 |
| නොවැම්බර් | 8,065 | 291,922,464 |
| දෙසැම්බර් | 8,201 | 296,785,190 |
| **එකතුව** | | **3,328,702,539** |

- වැටුප් හා අනෙකුත් පරිපාලන වියදම්

| වර්ෂය | වටිනාකම (රු' 000) |
|---|---|
| 2020 | 38,107,393 |
| 2021 | 38,591,300 |
| 2022 | 41,003,000 |
| 2023 | 43,968,727 |
| 2024 | 47,714,819 |

- රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ලැබීම් සහ ගෙවීම් (ජනවාරි- දෙසැම්බර්)

| මාසය | ලැබීම් (රු) | ගෙවීම් (රු) |
|---|---|---|
| ජනවාරි | 72,846,256 | 40,461,924 |
| පෙබරවාරි | 57,972,018 | 35,820,935 |
| මාර්තු | 69,197,430 | 31,737,220 |
| අප්‍රේල් | 52,421,618 | 49,351,197 |
| මැයි | 67,942,541 | 42,670,138 |
| ජුනි | 74,762,280 | 51,460,698 |
| ජුලි | 73,770,404 | 56,529,710 |
| අගෝස්තු | 78,921,601 | 66,304,132 |
| සැප්තැම්බර් | 59,655,240 | 44,524,477 |
| ඔක්තෝබර් | 60,810,735 | 45,689,326 |
| නොවැම්බර් | 40,608,374 | 45,462,053 |
| දෙසැම්බර් | 59,171,215 | 90,268,943 |
| **එකතුව** | **768,079,712** | **600,280,752** |

- රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට අලුතින් එක්වූ සහ ඉවත් වූ සාමාජික සංඛ්‍යාව (ජනවාරි- දෙසැම්බර්)

| මාසය | අලුතින් එක් වු සාමාජික සංඛ්‍යාව | ඉවත් වු සාමාජික සංඛ්‍යාව |
|---|---|---|
| ජනවාරි | 419 | 314 |
| පෙබරවාරි | 403 | 300 |
| මාර්තු | 453 | 390 |
| අප්‍රේල් | 239 | 378 |
| මැයි | 361 | 412 |
| ජුනි | 340 | 350 |
| ජුලි | 462 | 334 |
| අගෝස්තු | 292 | 417 |
| සැප්තැම්බර් | 210 | 390 |
| ඔක්තෝබර් | 343 | 365 |
| නොවැම්බර් | 397 | 426 |
| දෙසැම්බර් | 571 | 469 |
| **එකතුව** | **4,490** | **4,545** |

- අයකරන ලද වැන්දඹු/වැන්දඹු පුරුෂ දායක මුදල් ප්‍රමාණය (ජනවාරි - දෙසැම්බර්)

| විස්තරය | එකතු කරන ලද ආදායම (රු මිලියන) |
|---|---|
| මධ්‍යම රජය | 27,017 |
| පළාත් සභා | 16,085 |
| ගුරු වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල | 572 |
| **එකතුව** | **43,674** |

- රා.ප.ච 14/2022 යටතේ දේශීය සහ විදේශ නිවාඩු ලබා ගන්නා ලද නිලධාරීන්ගෙන් අය කරගනු ලැබූ  වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් දායක මුදල් ප්‍රමාණය

| මාසය | මුදල (රු) |
|---|---|
| ජනවාරි | 13,270,012 |
| පෙබරවාරි | 12,846,564 |
| මාර්තු | 14,089,912 |
| අප්‍රේල් | 15,157,688 |
| මැයි | 16,803,886 |
| ජුනි | 14,199,634 |
| ජුලි | 18,254,754 |
| අගෝස්තු | 18,566,515 |
| සැප්තැම්බර් | 16,390,857 |
| ඔක්තෝබර් | 18,931,045 |
| නොවැම්බර් | 18,886,845 |
| දෙසැම්බර් | 15,802,931 |
| **එකතුව** | **193,200,643** |

- **රජයට ආදායම් උපයාදීම**

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට අයත් දැනට කුලී පදනම මත ලබාදී ඇති ගොඩනැගිලි සඳහා ජනවාරි මස සිට දෙසැම්බර් මාසය දක්වා ගොඩනැගිලි කුලිය ලෙස රු.36,397,881.00 මුදලක් සහ නිවාඩු නිකේතන මගින් රු. 6,548,500.00 මුදලක් රජයේ ආදායම් වශයෙන් උපයාදී ඇත.

**- ඉටු කරන ලද කාර්යයන් පිළිබඳ විස්තර - නීති අංශය**

| ගොණු හා ලිපි වර්ගය | ප්‍රමාණය | නිරීක්ෂණ ලබා දී ඇති ප්‍රමාණය | උපදේශණ සඳහා සහභාගි වූ ප්‍රමාණය | අවසන් කිරීමට ඇති ප්‍රමාණය |
|---|---|---|---|---|
| මානව හිමිකම් පැමිණිලි | 96 | 94 | - | 02 |
| මානව හිමිකම් සිතාසි | 27 | - | 27 | - |
| ඔම්බුඩ්ස්මන් පැමිණිලි | 42 | 41 | 02 | 01 |
| ශ්‍රේෂ්ඨාධිකරණ නඩු | 04 | 04 | 04 | තීන්දු ලැබී නැත |
| අභියාචනාධිකරණ නඩු | 08 | 08 | 07 | තීන්දු ලැබී නැත |
| පළාත් බද මහාධිකරණ /දිසා අධිකරණ/මහේස්ත්‍රාත් අධිකරණ නඩු | 04 | 04 | 01 | තීන්දු ලැබී නැත |
| නීතිපති දෙපාර්තමේන්තු උපදෙස් සඳහා ගොනු | 05 | 05 | 03 | 01 |
| වෙනත් අංශ වලින් නිරීක්ෂණ සඳහා ලැබෙන ගොනු | 37 | 27 | | - |
| **එකතුව** | **223** | **183** | **44** | **04** |

- 2024 වර්ෂයේ ඉටුකර ඇති කාර්යන්හි ප්‍රගතිය - ප්‍රතිපත්ති අංශය

| අනු අංක | කාර්යය | අවසන් කර ඇති ඉල්ලීම් ප්‍රමාණය/ ඉදිරිපත් කර ඇති වාර්තා ප්‍රමාණය |
|---|---|---|
| 01 | අනියම්, ආදේශක, තාවකාලික, කොන්ත්‍රාත්, සහන, උපාධිධාරී අභ්‍යාසලාභී, පුහුණු, ත්‍රිවිධ හමුදා සේවා කාල විශ්‍රාම වැටුප ගණනයට අදාළ කර ගැනීම සඳහා අනුමැතිය ලබා දීම | 368 |
| 02 | පාර්ලිමේන්තු කාරක සභා වෙත නිරීක්ෂණ/නිර්දේශ වාර්තා සකස් කර ඉදිරිපත් කිරීම | |
| | i) මහජන පෙත්සම් කාරක සභාව වෙත ඉදිරිපත් වූ පෙත්සම්වලට අදාළව නිර්දේශ වාර්තා යොමු කිරීම | 21 |
| | ii) පාර්ලිමේන්තු වාචික පිළිතුරු අපේක්ෂිත ප්‍රශ්න සඳහා ලබා දීමට නිර්දේශිත පිළිතුරු සකස් කර ඉදිරිපත් කිරීම | 07 |
| | iii) අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා වෙත ගරු මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන ලද යෝජනා සඳහා නිරීක්ෂණ/ නිර්දේශ ඇතුළත් වාර්තා සකස් කර යොමු කිරීම | 07 |
| 03 | ආංශික අධීක්ෂණ කාරක සභා විසින් යොමු කරන කරුණු සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම හා ඊට අදාළ නිර්දේශ සකස් කර ඉදිරිපත් කිරීම | 05 |
| 04 | විශ්‍රාමිකයින්ගේ ගැටළු සම්බන්ධයෙන් විශ්‍රාමික සංගම් සමඟ සාකච්ඡා පැවැත්වීම | 02 |
| 05 | අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ ඉදිරිපත් කිරීම | 10 |
| 06 | විශ්‍රාම වැටුප් චක්‍රලේඛ නිකුත් කිරීම හා උපදෙස් ලිපි නිකුත් කිරීම | 14 |
| 07 | පුද්ගලයින් වෙනත් ආයතන සහ දෙපාර්තමේන්තුවේ අනෙකුත් අංශ වෙතින් යොමු කරන ගැටළු සඳහා ප්‍රතිපත්තිමය තීරණ ලබා ගැනීම | 195 |

- **අභ්‍යන්තර විගණන පරීක්ෂණ පැවැත්වීම**

විශ්‍රාම වැටුප් ගෙවීම් දත්ත පද්ධතියේ පවතින ගැටළු සහ විශ්‍රාම වැටුප් වංචා හා අක්‍රමිකතා අවම කර ගැනීම සඳහා අභ්‍යන්තර විගණන අංශය විසින් 2024 වසර තුළ දීද විගණන පරීක්ෂණ කටයුතු සිදු කරන ලදී. ඒ අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 12ක විගණන පරීක්ෂණ පැවැත්වීම, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 84ක විශ්‍රාම වැටුප් ගෙවීම් දත්ත පද්ධති පරීක්ෂාව, ලක්ෂ 15 ට වැඩි විශ්‍රාම වැටුප් ලිපිගොනු 440 ක් පරීක්ෂාව, විශේෂ විමර්ශන 03ක් පැවැත්වීම හා දෙපාර්තමේන්තු අභ්‍යන්තර අංශ විගණනය සහ සේවා අවශ්‍යතාවය මත විවිධ කරුණු සම්බන්ධයෙන් විගණන ක්‍රියාකාරකම් සිදු කර ඇත.

- **දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ ධාරිතා වර්ධනය හා සුබසාධනය සඳහා ගනු ලැබූ පියවර**

- දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ සුහදත්වය වර්ධනය කිරීම, කායික මානසික සෞඛ්‍ය තත්ත්වය යහපත්ව පවත්වා ගැනීම අරමුණු කරමින් දෙපාර්තමේන්තු ක්‍රීඩා සංගමය විසින් සිව්වන වරටත් සුහද ක්‍රිකට් තරඟාවලියක් සංවිධානය කරන ලදී. එමෙන්ම රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ සුබසාධක සංගමය මගින් පවත්වනු ලැබූ සැහැල්ලු පන්දු ක්‍රිකට් තරඟාවලියේදී දෙපාර්තමේන්තු ක්‍රිකට් කණ්ඩායම ශූරතාවය ලබා ගැනීමට සමත් විය.




**රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ සුබසාධක සංගමය මගින් පවත්වනු ලැබූ සැහැල්ලු පන්දු ක්‍රිකට් තරඟාවලියේදී විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු ක්‍රිකට් කණ්ඩායම ශූරතාවය ලබාගත් අවස්ථාව**

- රාජ්‍ය සේවා නෙට්බෝල් සංගමය මගින් පවත්වනු ලැබූ වාර්ෂික නෙට්බෝල් තරඟාවලියේ 2024 තරඟාවලියේදී D කාණ්ඩයේ අනුශූරතාවය දිනා ගැනීමට අවස්ථාව ලැබිණි.







**වාර්ෂික නෙට්බෝල් තරඟාවලියේ D කාණ්ඩයේ අනුශූරතාවය දිනාගත් අවස්ථාව**

- අතිශය කාර්යබහුල රාජකාරී පරිසරයෙන් මුදවා නිලධාරීන් හට මඳ අස්වැසිල්ලක් ලබාදීමේ අරමුණින් දෙපාර්තමේන්තු සුභ සාධක සංගමය මගින් සංවිධානය කරන ලද සිංහල දෙමළ අලුත් අවුරුදු උළෙල සාම්ප්‍රදායික ජන ක්‍රීඩාවලට මුල්තැන දෙමින් දෙපාර්තමේන්තු නිලධාරීන් සහ ඔවුන්ගේ පවුල්වල අයවලුන් සඳහා කැලණිය වෙදමුල්ල විශ්‍රාමික නිවාඩු නිකේතන පරිශ්‍රයේදී පැවැත්වීමට කටයුතු කරන ලදී.

- නාරාහේන්පිට රුධිර පාරවිලයන මධ්‍යස්ථානය වෙත ලේ පරිත්‍යාග කිරීම සඳහා දෙපාර්තමේන්තු නිලධාරීන් හට අවස්ථාව ලබා දෙමින් විශ්‍රාම වැටුප් සුබසාධක සංගමය විසින් සංවිධානය කළ ලේ පරිත්‍යාග කිරීමේ වැඩසටහනක් දෙපාර්තමේන්තු පරිශ්‍රයේදී පවත්වන ලදී.




ලේ පරිත්‍යාග කිරීමේ අවස්ථාව සඳහා සහභාගී වූ නිලධාරීන් පිරිසක්




**භෞතික වැඩිදියුණු කිරීම්**

- විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව යටතේ පරිපාලනය වන කැළණිය වෙදමුල්ල නිවාඩු නිකේතනය වාර්ෂිකව විශ්‍රාමිකයින් හා රාජ්‍ය නිලධාරීන් විශාල ප්‍රමාණයක් සඳහා නවාතැන් පහසුකම් සපයනු ලබන බැවින් එම පරිශ්‍රය තවදුරටත් සංවර්ධනය කර එහි ප්‍රතිලාභ විශ්‍රාමිකයින් වෙත ලබාදීමේ අරමුණින් එහි පවතින නිවාස කිහිපයක් අළුත්වැඩියා කිරීම.

## අභියෝග

- මාර්ගගතව ලැබෙන විශ්‍රාම වැටුප් අයඳුම්පත්‍ර විෂයභාර නිලධාරීන් අසම්පූර්ණව ඉදිරිපත් කිරීම හේතුවෙන් සැලකිය යුතු අයදුම්පත් ප්‍රමාණයක් ප්‍රතික්ෂේප කිරීමට සිදුවන බැවින් විශ්‍රාම වැටුප් විෂය රාජකාරි සිදු කරන නිලධාරීන් සඳහා එම විෂයය සම්බන්ධ පුහුණු වැඩසටහන් පවත්වමින් විෂය නිලධාරීන් නිරන්තරයෙන් දැනුවත් කිරීමට කටයුතු කිරීම.
- 2016.01.01 දිනට ට පසු රාජ්‍ය සේවයේ පත්වීම්ලාභීන් හට අදාළ වන විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ මෙතෙක් නිශ්චිත තීරණයක් ගෙන නොමැති බැවින් ඔවුන් සඳහා ප්‍රතිලාභ ගෙවීම් කිරීමේ ගැටළුකාරී තත්ත්වයක් පැවතීම සහ විශ්‍රාම වැටුප් වියදම ක්‍රමයෙන් ඉහළ යාම සහ මූල්‍ය ප්‍රතිපාදනවල පවතින හිඟතාවය හේතුවෙන් ජාතික දායකත්ව විශ්‍රාම වැටුප් ක්‍රමයක් හඳුන්වාදීම.
- රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 25/2014 ප්‍රකාරව ස්ථිර පත්වීම් ලබාදුන් නිලධාරීන්ගේ ස්ථිර පත්වීම් දිනය වන විට වයස අවුරුදු 45 ඉක්මවූ නිලධාරීන් හට විශ්‍රාම වැටුප් හිමිකම් ලබාදීම පිළිබඳ පැන නැඟී ඇති ගැටළු සඳහා මෙතෙක් නිශ්චිත පිළිතුරු නොලැබීම.
- වයස අවුරුදු 55 සම්පූර්ණ වී වෛද්‍ය මණ්ඩල වෙත ඉදිරිපත්වී ඇති සන්නද්ධ හමුදා සාමාජිකයින්ට දුබලතා විශ්‍රාම වැටුප් හිමිගැන්වීමට අදාළ ගැටලු විසඳීම.

- නිවාඩු නොලබා සේවයට වාර්තා නොකරන ලද හා 20% වන දුබලතාවයක් හිමි සන්නද්ධ සේවා හමුදා සාමාජිකයින්ට සේවා විශ්‍රාම වැටුප් ප්‍රදානය පිළිබඳ නෛතික තත්ත්වය සම්බන්ධයෙන් වන ගැටලු විසඳීම.
- විශ්‍රාමික මරණ පිළිබඳ (විශේෂයෙන් විදේශ විශ්‍රාමිකයින්) නියමිත පරිදි වාර්තා නොකිරීම නිසා විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවීමේ ගැටලුවට සාර්ථක විසඳුම් යෝජනා කිරීම.

## විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ ඉදිරි ගමන් මඟ

1. 1934 පෙබරවාරි 05 දින ප්‍රකාශයට පත් කර ඇති විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන සංශෝධනය කිරීම සඳහා ඉන්පසුව එනම්, 2024 වර්ෂය දක්වා නිකුත් කර ඇති සියලුම ගැසට් නිවේදනවල විධිවිධාන ඇතුළත් කරමින් විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යාවත්කාලීන කර ප්‍රකාශයට පත් කිරීම.
2. දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර ක්‍රියාවලි හා විශ්‍රාමික සේවා වඩා සරල කිරීම සඳහා IPMS ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ඇරඹීමත් එහි සංවර්ධන කාර්යයන් සිදු කර මුල් මොඩියුලයන්ගේ පරීක්ෂණ අවධි සම්පූර්ණ කර භාවිතය සඳහා මුදා හැරීම.
3. රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව සමඟ ඒකාබද්ධව විශ්‍රාම වැටුප් ලාභීන්ගේ මරණ කාර්යක්ෂමව වාර්තා කර ගැනීමේ ක්‍රමවේදයන් හඳුන්වා දීම. මෙමඟින් විශ්‍රාමික ජීවිත සහතික ලබා දීමේ ක්‍රමවේදය වඩාත් ලිහිල් කිරීම.
4. වැඩිදියුණු කරන ලද විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු නිල වෙබ් අඩවිය, විශ්‍රාමිකයින්ගේ දුම්රිය බලපත්‍ර ලබාගැනීම සඳහා වන තොරතුරු පද්ධතිය, වැන්දඹු අනත්දරු ක්‍රමයෙහි ලියාපදිංචි කිරීමේ නව තොරතුරු පද්ධතිය, රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ලියාපදිංචි කිරීමේ නව ප්‍රතිනිර්මාණය කරන ලද තොරතුරු පද්ධතිය යන දත්ත පද්ධති මුදා හැරීම.
5. කුලී පදනම මත ලබාදීමට ඇති දෙපාර්තමේන්තුව සතු ගොඩනැගිලි නියමිත කුලිය මත රාජ්‍ය ආයතන වෙත ලබාදීම.
6. අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාවේ මඟපෙන්වීම යටතේ දෙපාර්තමේන්තුව තුළ අල්ලස හා දූෂණයෙන් තොර සුපිළිපන් රාජ්‍ය සේවයක් බිහිකිරීමට අදාල ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම.
7. දෙපාර්තමේන්තුවේ නිතර විවේචනයට ලක්වන ක්ෂේත්‍රයක් වන දුරකථන ඇමතුම්වලට ප්‍රතිචාර නොදැක්වීමේ ගැටළුවට සාධනීය පිළිතුරක් වශයෙන් බාහිර පාර්ශවයන්ගේ දුරකතන ඇමතුම්වලට ප්‍රතිචාර දැක්වීමේ ක්‍රියාවලිය තවදුරටත් විධිමත් කිරීම.
8. Clean Sri Lanka රාජ්‍ය ප්‍රතිපත්තියට සමඟාමීව පාරිසරික, සාමාජීය හා ආචාර ධර්මීය වශයෙන් වන මූලික වෙනස්කම් දෙපාර්තමේන්තුව ආශ්‍රිතව සිදු කිරීම.



**චාමින්ද හෙට්ටිආරච්චි**
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

චාමින්ද හෙට්ටිආරච්චි
අධ්‍යක්ෂ ජනරාල්
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
මාලිගාවත්ත - කොළඹ 10

# 03.
# 2024.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන සමස්ථ මූල්‍ය කාර්ය සාධනය

## 3.1. මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

**2024.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

**මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය**

| සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2024 | | සටහන | 2024 (කක) | 2023 (කක) | |
|---|---|---|---|---|---|
| - | **ආදායම් ලැබීම්** | | | | |
| - | ආදායම් බදු | 1 | | - | ඒසීඒ-1 |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | | - | ඒසීඒ-1 |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | | - | ඒසීඒ-1 |
| 46,000,000,000 | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | 43,088,901,684 | 36,258,424,820 | ඒසීඒ-1 |
| 46,000,000,000 | **මුළු ආදායම් ලැබීම් (අ)** | | **43,088,901,684** | **36,258,424,820** | |
| | **ආදායම් නොවන ලැබීම්** | | . | | |
| | භාණ්ඩාගාර අග්‍රිම | | 384,901,000,000 | 365,816,860,000 | ඒසීඒ-3 |
| | තැන්පතු (වර්ෂය තුළ බැරකිරීම්) | | 105,881,351 | 65,687,256 | ඒසීඒ-4 |
| | අත්තිකාරම් ගිණුම් | | 61,476,724 | 63,208,428 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර ගිණුම් ලැබීම් | | 65,474,688,639 | 89,136,644,228 | |
| | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **450,543,046,714** | **455,082,399,912** | |
| | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | **493,631,948,398** | **491,340,824,732** | |
| | **භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)** | | - | - | |
| | **ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් (ඉ)= (ඇ)-(ඈ)** | | **493,631,948,398** | **491,340,824,732** | |
| | **අඩුකළා : වියදම්** | | | | |
| | **පුනරාවර්තන වියදම්** | | | | |
රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිලියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

පිටුව 2 | 17

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

**2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 ආදායම් කළමනාකරණය**

**පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.**

**(අ) ආදායම් සංකේතය - 20:04:01:00 (මධ්‍යම රජය)**

(I) 2001 ජනවාරි 15 දිනැති අංක 1/2001 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛයේ 1(අ) ඡේදය අනුව සෑම මසකම ගිණුම් සාරාංශ මඟින් හර හා බැර කරන ලද දායක මුදල් පිළිබඳ වාර්තාවක් ඊළඟ මාසයේ 15 දිනට ප්‍රථම විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙත එවිය යුතු බව දක්වා තිබුණ ද, එම විධිවිධාන අනුව සමාලෝචිත වර්ෂය තුළ දී වෙනත් ආයතන විසින් බැර කරන ලද රු.මිලියන 26,348ක දායක මුදල් පිළිබඳ බැර නිවේදන ගෙන්වා ගැනීමට හා වර්ෂය තුල සිදුකරන ලද රු.මිලියන 3.2ක හර කිරීම්වලින් රු.මිලියන 1.5

පිටුව 3 | 17

ක හර කිරීම් තහවුරු කර ගැනීම සඳහා අදාල ආයතන වලින් හර නිවේදන ගෙන්වා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(II) 2015 ජූලි 20 දිනැති අංක 01/2015 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛයේ 07 ඡේදය ප්‍රකාරව ආදායම් ගණන්දීමේ නිලධාරීන්ට අයත් ආදායම් සංකේත සඳහා මාසික වාර්තා එළඹෙන මාසයේ 10 දිනට පෙර රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කල යුතු වුවත් මාසික කාර්යසාධන වාර්තා දින 05 ත් දින 33 ත් අතර ප්‍රමාදයන් සහිතව ඉදිරිපත් කර තිබුණි.

(III) සමාලෝචිත වර්ෂයට අදාළ ආදායම් ඇස්තමේන්තුව රු.මිලියන 29,000 ක් වුවත් වර්ෂයේ ශුද්ධ ආදායම ලෙස රැස්කර තිබුණේ රු.මිලියන 27,012.7 ක් පමණි රු.මිලියන 1,987.3ක් අඩුවෙන් ආදායම් එකතු කර තිබූ අතර එය ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 6.85 ක අඩුවීමකි. මෙසේ ඇස්තමේන්තුගත ආදායම රැස්කර ගැනීමට නොහැකිව තිබුණේ 2024 ජනවාරි 10 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2024 අනුව 2024 අප්‍රේල් මාසයේ සිට වැන්දඹු දායක අනත්දරු දායක මුදල සියයට 8 දක්වා වැඩි කර තිබූ අවස්ථාවකදීය.

(IV) සමාජ සංරක්ෂණ දායක මුදල් (වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු දායක මුදල්) මධ්‍යම රජයට හා ආදායම් ගිණුම් යටතේ දායක වී තිබෙන නිලධාරීන් සම්බන්ධ දත්ත පද්ධතියක් පවත්වා ගැනීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් සමාජ සංරක්ෂණ ක්‍රමයෙන් ප්‍රතිලාභ ලැබීමට නියමිත සාමාජික සංඛ්‍යාව පිළිබඳ තොරතුරු නොමැති වීම තුල, ඒ අනුව හිමිවන වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් හා දායක මුදල් ගෙවීම් යනාදි ප්‍රතිලාභ හිමි ගැන්වීමේ දී දායක මුදල් නිශ්චිතව අඛණ්ඩව ලැබුණේ ද යන්න තහවුරු කරගැනීමට නොහැකි වී තිබුණි.

**(ආ) ආදායම් සංකේත අංකය 20:04:02:00 සමාජ සංරක්ෂණ දායක මුදල් (පළාත් සභා)**

(I) සමාජ සංරක්ෂණ දායක මුදල් පළාත් සභා ආදායම් ගිණුම යටතේ දායක වී තිබෙන නිලධාරීන් සම්බන්ධයෙන් දත්ත පද්ධතියක් පවත්වා ගෙන යාමට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර නොතිබුණු බැවින් වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් දායක මුදල් ආපසු ගෙවීම් යනාදි ප්‍රතිලාභ හිමි ගැන්වීමේ දී දායක මුදල ඒ ඒ පුද්ගලයාගෙන් නිශ්චිතව අඛණ්ඩව ලැබුණේ ද යන්න දෙපාර්තමේන්තුවට සනාථ කරගැනීමේ නිසි ක්‍රමවේදයක් නොතිබුණි.

(II) 2021 ජනවාරි 15 දිනැති අංක 01/2001 දරන විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛයේ 2.2 වගන්තිය ප්‍රකාරව පළාත් සභා විසින් සියලුම කාර්යාලවල දායක මුදල් වෙනුවෙන් එක් චෙක්පතක් නිකුත් කරන්නේ නම් සෑම මසකම අයකිරීම් ඊළඟ මාසයේ 15 දිනට පෙර ගෙන්වා ගත යුතු වුවද පළාත් සභා 6 ක දින 06 සිට දින 85 දක්වා කාල ප්‍රමාදයක් සිදු වී තිබුණද එම චෙක්පත් නැවත ගෙන්වා ගෙන නොතිබුණි.

(III) චෙක්පත් මඟින් දායක මුදල් එවනු ලබන ආයතන 03 ක් ඉදිරිපත් කරන ලද රු.358,128 ක් වටිනා චෙක්පත් විවිධ හේතු මත ආපසු හරවා යවා තිබුණත් 2025 මාර්තු 15 දිනට, දින 86 සිට දින 218 අතර කාලයක් ගත වී තිබුණ ද එම දායක මුදල් නැවත ගෙන්වා ගැනීමට කටයුතු කර නොතිබුණි.

පිටුව 4 | 17

(IV) මධ්‍යම හා දකුණු පළාත්වලින් 2024 වර්ෂය අවසානයේ ලද චෙක්පත් දෙකක් 2025 ජනවාරි මාසයේ උපලබ්ධි වී තිබියදී එම රු.මිලියන 183.6ක අගය සමාලෝචිත වර්ෂයේ හිඟ ආදායම් ලෙස හඳුනාගෙන නොතිබුණි.

(V) 2015 ජූලි 20 දිනැති අංක 01/2015 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛයේ 07 ඡේදය ප්‍රකාරව ආදායම් ගණන්දීමේ නිලධාරීන්ට අයත් ආදායම් සංකේත සඳහා මාසික වාර්තා එළඹෙන මාසයේ 10 දිනට පෙර රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතු වුවත් මාසික කාර්යසාධන වාර්තා දින 05 ත් 33 ත් අතර ප්‍රමාද කාලයක් සහිතව ඉදිරිපත් කර තිබු බව නිරීක්ෂණය විය.

(VI) සමාලෝචිත වර්ෂයට අදාළ ආදායම් ඇස්තමේන්තුව රු.මිලියන 17,000ක්ද රැස්කරන ලද ශුද්ධ ආදායම රු.මිලියන 16,076.1ක් ද වූ අතර රැස්කරන ලද ශුද්ධ ආදායමේ අඩුවීම ආදායම් ඇස්තමේන්තුවෙන් සියයට 5.43ක් හා වටිනාකම රු.මිලියන 923.8ක් විය. මෙසේ ඇස්තමේන්තුගත ආදායම රැස්කර ගැනීමට නොහැකිව තිබුණේ 2024 ජනවාරි 10 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2024 අනුව 2024 අප්‍රේල් මාසයේ සිට වැන්දඹු දායක අනත්දරු දායක මුදල සියයට 8 දක්වා වැඩි කර තිබු අවස්ථාවකදීය.

(ඇ) ගොඩනැගිලි කුලී

(I) විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට අයත් ගොඩනැගිලි කුලී පදනම මත ලබා දී තිබු ආයතන 12 කින් 2024 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු හිඟ කුලී ආදායම රු.9,405,597 ක් විය.

(II) විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු පරිශ්‍රයේ පවත්වාගෙන යන ලංකා බැංකු ස්වයංක්‍රිය ටෙලර් යන්ත්‍රය අක්‍රීය තත්ත්වයෙන් වසා තිබුණද යන්ත්‍රය ඉවත් කර නොතිබු අතර 2023 ඔක්තොම්බර් 01 සිට ගිවිසුම් ගත වීමක් හෝ කුලී අය කිරීමක් සිදු කර නොතිබුණි.

(III) සම්පත් බැංකුව වෙත කුලී පදනම මත ලබා දී ඇති මහ ලේකම් කාර්යාල පරිශ්‍රයේ ස්ථාපිත ස්වයංක්‍රිය ටෙලර් යන්ත්‍රය සඳහා වු බදු ගිවිසුම 2024 සැප්තැම්බර් 30 දින අවසන්ව තිබු නමුත් 2025 මාර්තු 31 දින වන විටත් නව ගිවිසුමකට එළඹීමකින් තොරව මාසික කුලිය අය කරමින් පවත්වාගෙන යමින් පැවතුණි.

(IV) මාලිගාවත්ත මහලේකම් පරිශ්‍රයේ කුලී පදනම මත ලබා දීමට හැකි ස්ථාන 03 ක් දීර්ඝ කාලයක් තිස්සේ කුලී පදනම මත ලබා දීමට උත්සාහ නොකිරීමෙන් වාර්ෂිකව රු.3,984,000ක ආදායමක් රජයට අහිමිවී තිබුණි.

### 3.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

2024 දෙසැම්බර් 31 දිනට බැරකම් රු.264,903ක් අඩුවෙන් දක්වා තිබුණි.

### 3.3 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන

පිටුව 5 | 17

පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**3.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය 237(අ) | 852,989 | කොන්ත්‍රාත්තුව හෝ ගිවිසුම අනුව සතුටුදායක ලෙස වැඩකර ඇති බවට හෝ සැපයුම් කර ඇති බවට ද, නිර්දේශිත ගෙවීම් ඒවාට අනුකූල වන බවට ද සහතිකයක් ඇමිණිය යුතු වුවත් අවස්ථා 04ක දී භාණ්ඩ ලැබුණු බවට තහවුරු කරගැනීමකින් තොරව එනම් භාණ්ඩ ලැබීමට පෙර ගෙවීම් කර තිබුණි. |
| (ආ) | 2010 දෙසැම්බර් 16 දිනැති අංක 13/2010 දරන හා 2013 සැප්තැම්බර් 20 දිනැති අංක 03/2013 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය | 2,668,686 | යළි විවාහ වන වැන්දඹුවට වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුපෙන් හා දීමනාවලින් සියයට 50 ක් හිමි වුවද නැවත විවාහයෙන් පසුවද සම්පූර්ණ වැටුප හා දීමනා ගෙවා තිබීම නිසා පානදුර, මහර හා ගල්වෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල විශ්‍රාමිකයින් 06 දෙනෙකු වෙත විශ්‍රාම වැටුප් හා දීමනා වැඩිපුර ගෙවීම් කර තිබුණි. |
| (ඇ) | 2011 ජුනි 30 දිනැති අංක 5/2011 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය | 275,625 | විදේශගත විශ්‍රාමිකයින් සඳහා ජීවන වියදම් දීමනාව රු.2000 ලෙස ගෙවිය යුතු වුවද , රු.11,025ක් ලෙස ගෙවීම නිසා කරුවලගස්වැව,ආරච්චිකට්ටුව හා ආණමඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල විශ්‍රාමකයින් 07 දෙනෙකු සඳහා ජීවන වියදම් දීමනාව වැඩිපුර ගෙවීම් කර තිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2014 ජනවාරි 10 දිනැති අංක 1/2014 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය හා 2010 සැප්තැම්බර් 07 දිනැති අංක 8/2010 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය | | රාජ්‍ය සේවකයකු ලබන රු. 7,800 ක ජීවන වියදම් දීමනාව ඉක්මවා විශ්‍රාමිකයෙකුට ජීවන වියදම් දීමනාව නොගෙවිය යුතු වුවත්, |
| | | 11,078,250 | (I) යැපෙන්නන් වෙත හමුදා සේවා වැටුප සමඟ ජීවන වියදම් දීමනාව නොගෙවිය යුතු වුවද, දත්ත පද්ධතිය අනුව අවස්ථා 20කදී ද,මාවතගම, පූජාපිටිය, ගනේවත්ත, මහර, මාස්පොත හා පානදුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල අවස්ථා 21කදී එසේ ගෙවීම හේතුවෙන් ජීවන වියදම් දීමනාව වැඩිපුර ගෙවීම් කර තිබුණි. |
| | | 139,850 | (II) ජීවන වියදම් දීමනාව සහිතව රජයේ වැටුපක් ලබන්නේ නම් එලෙස වැටුප් ලබන කාල සීමාව තුලදී විශ්‍රාම වැටුපට ජීවන වියදම් දීමනාව හිමි නොවුණද , එසේ ජීවන වියදම් දීමනාව ගෙවීම හේතුවෙන් නැගෙනහිර නුවරගම් පළාත, අතුරලිය, වලස්මුල්ල හා වීරකැටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල අවස්ථා 03 කදී ජීවන වියදම් දීමනාව වැඩිපුර ගෙවා තිබුණි. |
| | | 975,806 | (III) ජීවන වියදම් දීමනාව රු.7,800 දක්වා ලබා ගත හැකි වුවද කුණඩසාලේ, දමන, පූජාපිටිය, ගනේවත්ත, මහර, මාස්පොත, ගලේවෙල, මාවතගම, වැලිමඩ, පානදුර හා පුත්තලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල විශ්‍රාමිකයින් 66 දෙනෙකු සඳහා ජීවන වියදම් දීමනාව අඩුවෙන් ගෙවා තිබුණි. |
| (ඉ) | 2016 අප්‍රේල් 27 දිනැති අංක 03/2016 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය | 980,000 | 2016 ජනවාරි 01 දිනෙන් පසු විශ්‍රාම යන විශ්‍රාමිකයින් සඳහා අන්තර් දීමනාව හිමි නොවුනද විශ්‍රාමිකයින් 04 දෙනෙකු වෙනුවෙන් එසේ ගෙවීම හේතුවෙන් |

| | | | |
|---|---|---|---|
| | | | මාස්පොත, පානදූර, වලස්මුල්ල/වීරකැටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල අන්තර් දීමනාව වැඩිපුර ගෙවා තිබුණි. |
| (ඊ) | 2014 නොවැම්බර් 03 දිනැති අංක 13/2014 විශ්‍රාම වැටුප් චක්‍රලේඛය | 2,911,500 | විශ්‍රාම වැටුප් කිහිපයක් ඒකාබද්ධව ලබාගන්නා අවස්ථාවල මාසිකව ගෙවනු ලැබූ අන්තර් දීමනාව ඒකාබද්ධ විශ්‍රාම වැටුපට පමණක් ගෙවිය යුතු වුවත් මාවතගම, වැලිමඩ, කුණ්ඩසාලේ, පූජාපිටිය, වලස්මුල්ල, වීරකැටිය, ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් හා දත්ත පද්ධතිය මඟින් හඳුනාගත් විශ්‍රාමිකයින් 14 දෙනෙකු සඳහා අන්තර් දීමනාව වැඩිපුර ගෙවා තිබුණි. |
| (උ) | 2018 ජූලි 17 දිනැති අංක 9/2008 (සංශෝධන ii) දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය | | සන්නද්ධ සේවා විශ්‍රාම වැටුප (අංක -59 හා දුබලතා විශ්‍රාම වැටුප (අංක 6) ඒකාබද්ධ කර ගෙවීම් සිදුකළ යුතු වුවත් පූජාපිටිය, දමන, ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල විශ්‍රාමිකයින් 38 ක් සඳහා එසේ කටයුතු කර නොතිබුණි. |
| (ඌ) | 2019 ජූනි 11 දිනැති අංක 1/2019 දරණ විශ්‍රාම වැටුප් චක්‍රලේඛය | | (I) 2019 අයවැය යෝජනාව අනුව 2017 ජනවාරි 01 දිනට පෙර විශ්‍රාම ගත් රාජ්‍ය නිලධාරීන්ට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2016 අනුව විශ්‍රාම වැටුප් ගැලපීම 2019 ජූලි 01 දින සිට කළයුතු වුවත් මහර, මාස්පොත, දමන, පූජාපිටිය, ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල විශ්‍රාමිකයන් 61 දෙනෙකුගේ විශ්‍රාම වැටුප් සංශෝධනයන් සකස් කර නොතිබුණි. |
| | | 963,100 | (II) යම් පුද්ගලයෙකු වැන්දඹු විශ්‍රාම වැටුප සමඟ යැපීම් දීමනාව ලබාගන්නා අවස්ථාවක එම වැන්දඹු විශ්‍රාම වැටුප, විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 01/2019 ප්‍රකාරව සංශෝධනය කළ පසු යැපීම් දීමනාව සඳහා ගෙවනු ලබන අන්තර් දීමනා ගෙවීම නතර කළ යුතු වුවද නැගෙනහිර නුවරගම් පළාත, පැල්මඩුල්ල, වැලිමඩ, පූජාපිටිය, වලස්මුල්ල/වීරකැටිය |

පිටුව 8 | 17

| | | | |
|---|---|---|---|
| | | | ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාමිකයින් 09 දෙනෙකුට එසේ නතර නොකර යැපීම් දීමනාව වෙනුවෙන් අන්තර් දීමනාව ගෙවීමෙන් අන්තර් දීමනාව වැඩිපුර ගෙවා තිබුණි. |
| | | 2,675,000 | (III) 2019 ජූනි 11 දිනැති අංක 01/2019 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය අනුව වැටුප් සංශෝධනයට පසුව විශ්‍රාම වැටුප සමඟ ගෙවනු ලබන අන්තර් දීමනාව නතර කළයුතු වුවද මහර, දමන, පානදුර, ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල අවස්ථා 14කදී එසේ නතර නොකොට ගෙවීම හේතුවෙන් අන්තර් දීමනාව වැඩිපුර ගෙවා තිබුණි. |
| (එ) | 2019 ජූලි 26 දිනැති අංක 1/2019 සංශෝධන II දරණ විශ්‍රාම වැටුප් චක්‍රලේඛය | 4,538,038 | ත්‍රිවිධ හමුදා මඟින් ගෙවනු ලබන වයස අවුරුදු 55 දක්වා වැටුප් ලබමින් සිටින විශ්‍රාමිකයින්ට හා යැපෙන්නන්ට වැටුප් පරිවර්තනය අදාල නොවන බව දක්වා තිබියදී දත්ත පද්ධතියට අනුව හමුදා වැටුප ලබන යැපෙන්නන් 06 දෙනෙකුගේ හා මාවතගම, වැලිමඩ, මහර,පානදුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල විශ්‍රාමිකයින් 10 දෙනෙකුගේ විශ්‍රාම වැටුපද සංශෝධනය කර ගෙවීම හේතුවෙන් විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවීම් කර තිබුණි. |
| (ඒ) | 2022 ජනවාරි 20 දිනැති අංක 01/2022 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය | | |
| | (i) 2ඡේදය | 1,200,000 | වැලිමඩ, පූජාපිටිය, ගනේවත්ත, මාස්පොත ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල විශ්‍රාමිකයින් 20 දෙනෙකු සඳහා ඔවුන්ට හිමි රු. 5000 ක දීමනාව ගෙවා නොතිබීම හේතුවෙන් එම දීමනාව අඩුවෙන් ගෙවා තිබුණි. |
| | (ii) 2(i) ඡේදය | 180,000 | කිසියම් තැනැත්තෙකු විශ්‍රාම වැටුප් කිහිපයක් ලබන විට එවැනි |

පිටුව 9 | 17

| | | |
|---|---|---|
| | | තැනැත්තෙකුට හිමි වනුයේ මසකට එක් දීමනාවක් පමණක් වුවද විශ්‍රාම වැටුප් වර්ග කිහිපයක් සඳහා වෙන් වෙන් වශයෙන් රු.5000 දීමනාව වැඩිපුර ගෙවීම් සිදුකළ අවස්ථා 01 ක් පානදුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් නිරීක්ෂණය විය. |
| (iii) 2(iii) ඡේදය | 915,000 | මියගිය ත්‍රිවිධ හමුදා නිලධාරීන් වෙනුවෙන් ඔවුන්ගේ අවුරුදු 55 දක්වා වැටුප් හිමි යැපෙන්නන්ට විශ්‍රාම වැටුප සමඟ රු.5,000 විශේෂ දීමනාව හිමි නොවන බව දක්වා තිබුණද දත්ත පද්ධතියට අනුව යැපෙන්නන් 06 දෙනෙකු සඳහාද මාවතගම, මහර ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල යැපෙන්නන් 04 දෙනෙකු සඳහාද සේවා වැටුප සමඟ දීමනාව ගෙවීම් කර තිබූ බැවින් විශේෂ දීමනාව වැඩිපුර ගෙවා තිබුණි. |

**3.5 රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) 2024 දෙසැම්බර් 31 දිනට රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමේ කේවල ශේෂ එකතුව රු.167,676,744ක් වී තිබුණු අතර, එයින් වසරකට වඩා අඩු ණය ශේෂය රු.1,559,825ක් විය. එම ශේෂයෙන් පළාත් සභා ආයතනවලට මාරු වී ගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් අය විය යුතු ණය ශේෂය රු.611,203ක් ද, වැඩ තහනම් කර ඇති නිලධාරීන් තුන් දෙනෙකුගෙන් අය විය යුතු ණය ශේෂය රු.622,320ක් ද, සේවය අතහැර ගොස් ඇති නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු ණය ශේෂය රු.326,302ක්ද විය. වසර 1-3 අතර අය විය යුතු ණය ශේෂය රු.142,920ක් වු අතර එය සේවය අතහැර ගොස් ඇති නිලධාරියෙකුගෙන් අය විය යුතු ණය ශේෂයක් විය.

(ආ) වසර 3-5 අතර අය විය යුතු ණය ශේෂය රු.239,812ක් වු අතර එම ණය ශේෂය වැඩ තහනම් කර ඇති නිලධාරියෙකුගෙන් අය විය යුතු ණය ශේෂයක් විය. වසර 5-10 අතර වැඩ තහනම් කර ඇති නිලධාරියෙකුගෙන් අය විය යුතු ණය ශේෂය රු.153,509ක් විය. වසර 10-20 අතර අය විය යුතු ණය ශේෂය රු.305,220ක් වු අතර එයින් සේවය අතහැර ගොස් ඇති නිලධාරියෙකුගෙන් අය විය යුතු ශේෂය රු.130,728ක් ද වැඩ තහනම් කර ඇති නිලධාරියෙකුගෙන් අය විය යුතු ණය ශේෂය රු.174,492ක් විය.

## 3.6 තැන්පතු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) වර්ෂ 02 ක් ඉක්මවූ රු.4,965,310ක තැන්පත්, මුදල් රෙගුලාසි 571(3) පරිදි ප්‍රයෝජනයට ගැනීමෙන් හෝ රාජ්‍ය ආදායමට ගැනීමෙන් තොරව පොදු තැන්පත් ගිණුමෙහි රඳවාගෙන ඇති බව නිරීක්ෂණය විය.

(ආ) පෞද්ගලික දුරකථන ආයතනය හා දෙපාර්තමේන්තුව අතර පවතින 2023 මාර්තු 01 දිනැති අවබෝධතා ගිවිසුම අනුව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ගෙවිය යුතු මුදල් වශයෙන් 2024 මැයි 08 දින දුරකථන ආයතනය වෙතින් රු.5,000,000ක මුදලක් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ලැබී තිබූ අතර 2024 මැයි 29 දින පොදු තැන්පත් ගිණුමේ තැම්පත් කර තිබුණි. අදාළ අවබෝධතා ගිවිසුමේ 4.8 ඡේදයේ ඇමුණුම 2හි සඳහන් වැඩසටහන් සඳහා මෙම මුදල් භාවිතා කළ හැකි බව සඳහන් කර තිබුණද විගණිත දිනය වූ 2024 මාර්තු 31 දක්වා මෙම මුදල් උපයෝජනය නොකර තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

## 3.7 බැංකු ගිණුම් මෙහෙයවීම

පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලේ බැංකු ගිණුම හා පළාත් පාලන සේවා වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප්වලට අදාළ බැංකු ගිණුම් පසුගිය වර්ෂ ගණනාවක සිටම අක්‍රිය ගිණුම් ලෙස පවතින අතර ඒවා වසා දැමීම හෝ ඒ සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 ප්‍රසම්පාදනයන්

වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම අනුව ඩෙස්ක්ටොප් පරිගණක 85ක්ද මොනිටර් 10ක් ද 2024 අප්‍රේල් 01 දින සිට 2024 ජුනි 30 දක්වා කාලය තුළ මිලදී ගැනීමට සැලසුම් කර තිබුණද, 2024 නොවැම්බර් 22 දිනැතිව ප්‍රසම්පාදන සැලැස්ම නැවත සංශෝධනය කර පරිගණක 20 හා මොනිටර් 06 මිලදී ගැනීම හේතුවෙන් 253-1-2-2509 වැය විෂය වෙනුවෙන් වෙන් කල මුදලින් රු. 11,091,000 ක් ඉතිරි වී තිබුණි.

## 4.2 පාඩු හා හානි

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

### 4.2.1 හානි පාඩු ලේඛනය

මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය අවසාන වන විට තව දුරටත් අයකරගත යුතු වැඩිපුර ගෙවන ලද විශ්‍රාම වැටුප් වටිනාකම රු. මිලියන 1119ක් වී තිබුණි. මෙම ශේෂය වර්ෂ 10කට වඩා වැඩි කාලයක සිට පැවත එන රු. මිලියන 3.1 කින් ද වර්ෂ 5ත් 10 ත් අතර දක්වා කාල පරාසයක සිට පැවත එන රු.මිලියන 47.3 කින්ද වර්ෂ 5 ට අඩු කාලයකට අයත් රු.මිලියන 1,068 කින්ද සමන්විත විය.

පිටුව 11 | 17

(අ) හානි හා පාඩු ලේඛනයේ වසර 10 කට වැඩි හානි වීම් වටිනාකම රු.මිලියන 3.1 න් රු.මිලියන 2.3ක් මියගිය පුද්ගලයන් වෙනුවෙන් වැඩිපුර ගෙවීම් වන අතර ඒවා නැවත අයකර ගත නොහැකි තත්වයක් පැවතුණද මුදල් රෙගුලාසි අනුව කටයුතු නොකර වසර 10 කට වැඩි කාලයක සිට මූල්‍ය ප්‍රකාශන වල ශේෂයක් ලෙස නිරූපණය කර තිබුණි.

(ආ) හානි හා පාඩු ලේඛනයේ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙන් කරනු ලබන අයකිරීම් යටතේ 2024 වර්ෂයේ අයකර ගත් වටිනාකම ලෙස 2023 වර්ෂයේ අවසන් ශේෂය හා 2024 වර්ෂයේ අවසන් ශේෂය අතර වෙනස දක්වා තිබුණි. ඒ අනුව 2023 දෙසැම්බර් 31 දිනට අයකරමින් සිටි ශේෂයක් සහිත විශ්‍රාමිකයකු 2024 වර්ෂයේදී මිය ගිය හොත් ඔහුගෙන් අයවිය යුතු මුළු වටිනාකම 2024 ලැබීම් ලෙස හඳුනාගනු ලබයි.ඒ අනුව කුරුණෑගල දිස්ත්‍රික්කයේ මියගිය විශ්‍රාමිකයකයින් 06දෙනෙකුගෙන් තවදුරටත් අයකර ගැනීමට ඇති රු.662,960 ක ශේෂයක් 2024 වර්ෂයේ ලැබීම් ලෙස හඳුනා ගැනීමෙන් හානි පාඩු ලේඛනයේ 2024 දෙසැම්බර් 31 දිනට අයවීමට ඇති ශේෂය එම අගයෙන් අඩුවෙන් දක්වා තිබුණු බව නියැදි විගණන පරීක්ෂණයේදී අණාවරණය විය .

(ඇ) විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ වාර්තා අනුව ස්ථාවර දීමනා ලාභීන් 43 දෙනෙකු මිය යාම නිසා වැඩිපුර ගෙවා තිබූ අයකරගත නොහැකිව ඇති රු.7,151,395 ක් හානි පාඩු ලේඛනයේ ඇතුළත්ව නොතිබුණි.

(ඈ) තාවකාලික ගොනුවක් මඟින් ගම්පහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් ද, ස්ථාවර ගොනුවක් යටතේ මහර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් ද එකම විශ්‍රාමිකයෙකු වෙත 1991 වර්ෂයේ සිට 2016 පෙබරවාරි මාසය දක්වා අවුරුදු 25 ක් විශ්‍රාම වැටුප් ගෙවීම් කර තිබුණි. ඒ අනුව ගම්පහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් රු.1,872,587 ක මුදලක් තාවකාලික ගොනුව යටතේ විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවීම් කර තිබුණු අතර විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් 2016 අප්‍රේල් සිට විශ්‍රාම වැටුප් ගෙවීම අත්හිටුවා ඇති අතර 2021 මාර්තු 25 දින ඔහු මියගොස් තිබුණි. ඒ වන විට රඳවාගත් විශ්‍රාම වැටුප මඟින් පියවී තිබූ පාඩුව රු.1,577,343 ක් වූ අතර තවදුරටත් අයකර ගැනීමට ඇති මුදල රු.295,044 ක් වේ. මෙම පාඩුව අයකර ගන්නා ආකාරය පිළිබඳ පැහැදිලි නිගමනයකට එළඹ නොතිබුණු අතර මුදල් රෙගුලාසි 110 යටතේ අලාභ හානි ලේඛනයට මෙම අලාභ හානිය ඇතුළත් කර නොතිබුණි.

(ඉ) ගම්පහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත විශ්‍රාමිකයෙකුගේ මිය යාම වාර්තා නොවීම හේතුවෙන් මාස 29 ක කාලයක් සඳහා රු.582,423 ක් වැඩිපුර ගෙවීම් කර තිබුණි. ඊට අදාල මූලික විමර්ශන වාර්තාව අනුව ගම්පහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාම වැටුප් අංශයේ රාජකාරි සිදුකළ නිලධාරීන් ජීවිත සහතික පරීක්ෂා කිරීමේ ක්‍රියාවලිය සම්පූර්ණ නොකිරීම නිසා බාහිර පාර්ශවයන්ට මුදල් ලබාගැනීමට ඉඩ සලසා තිබූ බව නිරීක්ෂණය කර තිබුණද නිලධාරීන්ට අවවාද කර ලිපියක් නිකුත් කිරීම සඳහා පමණක් නිර්දේශ ලබා දී තිබුණු අතර ගණකාධිකාරීවරුන් අධීක්ෂණ කටයුතු සිදු නොකිරීම නිසා රජයට සිදු වූ පාඩුව සම්බන්ධයෙන් එම නිලධාරීන්ට ආයතන සංග්‍රහයේ ලඝු විනය කාර්ය පටිපාටිය අනුව කටයුතු කිරීමට නිර්දේශ කර තිබුණද ඒ සම්බන්ධයෙන් කටයුතු කර නොතිබූ බව නිරීක්ෂණය විය.

පිටුව 12 | 17

තවද මුදල් රෙගුලාසි 110 යටතේ අලාභ හානි ලේඛනයට මෙම අලාභ හානිය ඇතුළත් කර නොතිබුණු අතර වැඩිපුර ගෙවීම අයකර ගැනීම සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග පිළිබඳ තොරතුරු ඉදිරිපත් නොවුණි.

**4.2.2 අලාභ අයකර ගැනීම.**

හානි පාඩු ලේඛනය තුල දක්වා තිබූ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන අංශය හා පාලන අංශය විසින් අනාවරණය කර ගන්නා ලද මූල්‍ය අක්‍රමිකතා වල 2024 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ශේෂය රු.44,299,996ක් වූ අතර ඒ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) මතුගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදාලව 2021 වර්ෂයේදී අනාවරණය කරගෙන තිබූ රු.7,022,668ක මූල්‍ය වංචාව සම්බන්ධයෙන් 2024 මාර්තු වන විටත් මු.රෙ. 104 ප්‍රකාරව පරීක්ෂණ පවත්වා අදාල කටයුතු ඉටු කර නොතිබුණි.

(ආ) ගම්පහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මියගිය විශ්‍රාමිකාවක් සඳහා මියයාමෙන් පසු මාස 55ක් විශ්‍රාම වැටුප් ගෙවීමෙන් රු.2,696,303 ක් වැඩිපුර ගෙවීම් කර තිබුණු අතර ඒ සඳහා මු.රෙ. 104 පරීක්ෂණ පවත්වා නොතිබුණි. මේ සම්බන්ධයෙන් සිදු කරන ලද මූලික විමර්ශනය අනුව එක් නිලධාරියෙකු වෙත චෝදනා පත්‍ර නිකුත් කර තිබූ අතර ඒ සඳහා පවත්වන ලද විධිමත් විනය පරීක්ෂණයෙන් ඔහු නිදොස් කොට නිදහස් කර තිබුණද සෙසු නිලධාරීන් සඳහා ලඝු විනය පටිපාටිය යටතේ නිදහසට කරුණු විමසීම කරන ලෙස කරන ලද නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි. ඒ අනුව අලාභය අයකරගන්නා ආකාරය පිළිබඳ නිගමනයකට එළඹ නොතිබුණි.

(ඇ) කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හිටපු විශ්‍රාම වැටුප් නිලධාරියෙකු කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සේවය කරමින් සිටියදී විශ්‍රාම වැටුප් පරිගණක පද්ධතියේ දත්ත කූට ලෙස වෙනස් කර විශ්‍රාමිකයින් නොවන පුද්ගලයින් තිදෙනෙකුගේ පෞද්ගලික බැංකු ගිණුම්වලට රජයේ මුදල් වංචනික ලෙස බැර කරමින් 2010 ජුනි 10 සිට 2011 ජුනි 09 දක්වා කාලය තුළ රු.6,381,550 ක මුදලක් වංචා කර තිබූ අතර මේ සම්බන්ධයෙන් සිදු කළ විධිමත් විනය පරීක්ෂණය අනුව නිලධාරියා සේවයෙන් පහ කර තිබුණි. එසේ වුවද මු .රෙ. 104(4) යටතේ අලාභ හානි වාර්තාව 2019 අගෝස්තු 21 දින පරීක්ෂණ මණ්ඩලය විසින් ලබා දී තිබුණද , වාර්තාවේ 10 වන ඡේදයේ නිලධාරියාගේ පෞද්ගලික නිශ්චල හා චංචල දේපළ/වත්කම් මගින් අයකරගත යුතු බවද දක්වා තිබියදීත් මේ දක්වා අලාභය අයකර නොතිබුණි.

(ඈ) ගල්නෑව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාම වැටුප් නිලධාරිනික විසින් සිදු කර ඇති මූල්‍ය අක්‍රමිකතාව රු.1,666,762 ක් වන අතර 2024 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ශේෂය රු.205,402ක් විය. 2012 වර්ෂයේදී හඳුනාගත් මෙම වංචාව සම්බන්ධයෙන් මු.රෙ.104 පරීක්ෂණයක් හා විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) පොල්ගහවෙල/බණ්ඩාරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2014 වර්ෂයේදී හඳුනාගන්නා ලද රු.5,049,611ක අලාභයක්ද, කුරුවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2014 වර්ෂයේදී හඳුනාගන්නා ලද රු.5,215,589ක අලාභයක්ද හානි

පිටුව 13 | 17

පාඩු ලේඛනය තුළ දක්වා තිබුණද 2024 දෙසැම්බර් 31 දිනට අයකර ගැනීමේ ප්‍රගතියක් නොතිබූ අතර මූ.රෙ. පරීක්ෂණ හා විනය පරීක්ෂණ පවත්වා නොතිබුණි.

### 4.3 කලමනාකරණ දුර්වලතා

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

### 4.3.1 සක්‍රිය සේවයේ යෙදී සිටියදී ජීවිතක්ෂයට හෝ දුබලතාවයට පත්වූ ත්‍රිවිධ හමුදා හා පොලිස් සේවා සාමාජිකයින්ට වන්දි වැටුප් හා දීමනා ගෙවීම

#### 4.3.1.1 හමුදා දුබලතා වැටුප් ගෙවීම් ක්‍රියාවලියේ දුර්වලතා

(අ) හමුදා සේවයේ නියුක්තිකයන්ද විශ්‍රාම ගැන්වීමේ සාමාන්‍ය ක්‍රමවේදය ප්‍රකාරව එනම් විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවේ 2.17 වගන්තියෙන් විශ්‍රාම ගන්වා විශ්‍රාම වැටුප් ගෙවීම ආරම්භ කරනු ලබන අතර අදාළ සේවා නියුක්තිකයා වෙත හමුදා වෛද්‍ය මණ්ඩලය වෙතින් සේවයට නුසුදුසු යැයි තීරණය කර හමුදාපති විසින් නිර්දේශ කර ඇත්නම් දුබලතා විශ්‍රාම වැටුපක් ගෙවනු ලැබේ. අදාල විශ්‍රාමිකයාගේ දුබලතාවය සිදු වූ දිනය හා වෛද්‍ය මණ්ඩලයට ඉදිරිපත් කළ දිනය අතර දිගුකාල පරාසයක් ගත කර තිබූ අතර දුබලතාවය සිදු වූ කාලවකවානුව තුලදීම වෛද්‍ය මණ්ඩලයට ඉදිරිපත් කර දුබලතාවය හඳුනාගැනීමට කටයුතු නොකිරීමෙන් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට මූලික වැටුප්, ජීවන වියදම් දීමනා, අන්තර් දීමනා හා පාරිතෝෂික දීමනා යන සියල්ලම වැඩිපුර ගෙවීම සිදුවේ. ඒ අනුව ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රු.11,433,021 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ආ) **හමුදා දුබලතා වැටුප් වැඩිපුර ගෙවීම**

පහත සඳහන් අවස්ථා වලදී හමුදා දුබලතා වැටුප් වැඩිපුර ගෙවා තිබුණි.

(i) ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාම වැටුප් අංක 59-1176493 දරන විශ්‍රාමිකයාට 6-59 ඒකාබද්ධ නොකිරීම හේතුවෙන් දුබලතා වැටුප රු.194,496 ක් වැඩිපුර ගෙවා තිබුණු අතර ඔහු 2022 මාර්තු 7 සිට අතුරුදහන් වීම හේතුවෙන් එම වැඩිපුර ගෙවූ මුදල් 2024 දෙසැම්බර් දක්වාත් අයකර ගැනීමට හෝ අදාල නිශ්චිත ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) 2013 ඔක්තෝබර් 10 දිනැති දුබලතා විශ්‍රාම වැටුප් ප්‍රදාන පත්‍රය අනුව මහර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාම වැටුප් අංක 3-1153570 දරන සන්නද්ධ සේවා විශ්‍රාම වැටුපට හිමි දුබලතා විශ්‍රාම වැටුප 2015 අගෝස්තු 20 දින නතර විය යුතු වුවද එසේ නතර නොකර විගණිත දිනය දක්වා රු.471,332 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(iii) මාවතගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ හමුදා විශ්‍රාම වැටුප් අංක 3-1168861 හිමි විශ්‍රාමිකයා 2015 දෙසැම්බර් 12 දින සිට හමුදා සේවයෙන් විශ්‍රාම ලබා 2016 මැයි 09 දින සිට යුධ හමුදාව මඟින් වැටුප් හා දීමනාව ලබන අතර 2018 ජූලි 19 දින සිට දුබලතා විශ්‍රාම වැටුප සක්‍රිය කිරීම හේතුවෙන් මූලික විශ්‍රාම වැටුප සංශෝධනය වී තිබුණද එම සංශෝධන ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන්

පිටුව 14 | 17

පාරිතෝෂික දීමනාව රු.128,124.00 ක්ද 2016 මැයි 09 සිට 2024 මැයි 10 දක්වා මූලික විශ්‍රාම වැටුප රු.517,834.50 ක්ද වැඩිපුර ගෙවා තිබුණි.

(iv) මාවතගම ලේකම් කාර්යාලයේ හමුදා විශ්‍රාම වැටුප් අංක 3-1327628 දරන විශ්‍රාමිකයා 2018/01/19 සිට විශ්‍රාම ලබා තිබූ අතර විශ්‍රාම වැටුප දුබලතාවය සමඟ 2018/01/19 සිට සංශෝධනය කර තිබුනද, සංශෝධිත විශ්‍රාම වැටුප නොගෙවා ආරම්භක විශ්‍රාම වැටුප ගෙවීම හේතුවෙන් පාරිතෝෂික මුදල රු.130,564 ක්ද විශ්‍රාම වැටුප් රු. 99,638 ක්ද, ජීවන වියදම් දීමනාව රු.28,200 ක්ද වැඩිපුර ගෙවා තිබුණි.

**4.3.1.2 ස්ථාවර දීමනාව ගෙවීම**

යුධමය වාතාවරණය පැවැති වකවානුවේ මිය ගිය ත්‍රිවිධ හමුදා සහ විශේෂ බලකා ඇතුළු පොලිස් සාමාජිකයින්ගේ යැපෙන්නන් වෙත ආරක්ෂක අමාත්‍යාංශයේ MOD/1/2021 හා 2021 මැයි 18 දිනැති චක්‍රලේඛයේ විධිවිධාන පරිදි විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව ස්ථාවර මාසික දීමනාවක් ගෙවනු ලබන අතර ඒ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) පානදුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දත්ත පද්ධතිය පරීක්ෂා කිරීමේ දී ස්ථාවර දීමනාව හිමි රණවිරුවන්ගේ යැපෙන්නන් 05 දෙනෙකු ස්ථාවර දීමනාව ලබන බව නිරීක්ෂණය වුවද ස්ථාවර දීමනාව ගෙවීමට අදාළ කිසිදු තොරතුරක් විශ්‍රාමික ගොනුවල ඇතුළත් නොවීම නිසා ගෙවන ලද ස්ථාවර දීමනාවේ වටිනාකමේ නිරවද්‍යතාවය හා ස්ථාවර දීමනාව ලැබීමට ඇති හිමිකම යනාදිය තහවුරු කරගැනීමට නොහැකි විය.

(ආ) විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් විගණනය වෙත ඉදිරිපත් කර තිබූ තොරතුරු අනුව ස්ථාවර දීමනා ලාභීන් මියගොස් ඇතත් ඒ බව වාර්තා නොවීම හේතුවෙන් 2025 මැයි වන විට රු.3,884,706 ක් අයකර ගැනීමට නොහැකිවී තිබුණි.

**4.3.1.3 සන්නද්ධ හමුදා විශ්‍රාම වැටුප් හා පසු ප්‍රතිලාභ කලමනාකරණය**

(අ) ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාම වැටුප් අංක 3-1146072 දරන විශ්‍රාමිකාව 2012 ඔක්තෝබර් 09 දින සේවයෙන් විශ්‍රාම ගෙන තිබූ අතර 2012 ඔක්තෝබර් 09 සිට 2022 ඔක්තෝබර් 09 දක්වා යුධ හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික සංග්‍රහයේ 18(1)(අ) යටතේ සේවා කාලයට අනුව පරිවර්තනයට පසු මාසික වැටුප රු.21,514 ක් ගෙවිය යුතු වුවත් පරිවර්තිතයට පෙර මාසික වැටුප වන රු. 24,632 ක් ආරම්භයේ සිට ගෙවීම හේතුවෙන් 2024 දෙසැම්බර් දක්වා රු.374,162 ක් විශ්‍රාම වැටුප් වැඩියෙන් ගෙවා තිබුණි.

(ආ) ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාම වැටුප් අංක 40-3057 දරන වැන්දඹු හමුදා විශ්‍රාමිකයාගේ කලත්‍රයාගේ අවුරුදු 55 වයස 2021 ජූලි 27 දින සම්පූර්ණ වීමෙන් අනතුරුව පරිවර්තිත විශ්‍රාම වැටුප 2022 අප්‍රේල් 08 සිට පිහිටුවා තිබුණ ද වයස සම්පූර්ණ වූ 2021 ජූලි 21 සිට 2022 අප්‍රේල් 07 දින දක්වා කාලපරිච්ඡේදයට අදාළව හිඟ වැටුප ගණනය කර ගෙවීම් කර නොතිබීමෙන් රු. 270,515 ක විශ්‍රාම වැටුප් හා රු.24,675 ක ජීවන වියදම් දීමනා වශයෙන් එකතුව රු. 295,190 ක් අඩුවෙන් ගෙවා තිබුණි.

පිටුව 15 | 17

(ඈ) ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාම වැටුප් අංක 41-2016532 දරන විශ්‍රාමිකාව වෙත හමුදා අනත්දරු වැටුපක් ගෙවනු ලබන අතර ඇය 2016 අප්‍රේල් 15 නැවත විවාහ වී තිබුණු අතර 2024 දෙසැම්බර් වනවිට හමුදා සෙබලාට දාව 2000 සැප්තැම්බර් 20 හා 2004 මැයි 25 ඉපදුන අනත්දරුවන් දෙදෙනෙකු සිටිය ද එම දරුවන් දෙදෙනාම අවුරුදු 18 සම්පූර්ණ වීම පිළිවෙලින් 2018 වර්ෂයේ හා 2022 වර්ෂයේ සිට වුවද අදාළ විශ්‍රාම වැටුප දරුවන්ට හිමිගැන්වීමෙන් තොරව 2025 ජනවාරි දක්වාම වැන්දඹු භාර්යාවට ගෙවමින් පවතින බව නිරීක්ෂණය විය.

(ඇ) මහර, ගණේවත්ත හා පානදුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අදාලව හමුදා විශ්‍රාමිකයින් 05 දෙනෙකුගේ විශ්‍රාම වැටුප් සංශෝධන නිසි පරිදි ක්‍රියාත්මක නොකිරිම හේතුවෙන් එක් විශ්‍රාමිකයෙකුගේ විශ්‍රාම වැටුප් රු.178,769ක් අඩුවෙන්ද, විශ්‍රාමිකයින් 04 දෙනෙකුගේ විශ්‍රාම වැටුප් රු.1,275,557ක් වැඩියෙන්ද ගෙවීම් කර තිබුණි.

(ඉ) පානදුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාම වැටුප් අංක 4-37014 (370920770v) දරන යැපීම් දීමනාවට අදාළ ගොනුව අනුව වැඩිපුර ගෙවා තිබූ රු.310,100 ක්වූ අන්තර් දීමනාව හා ජීවන වියදම් දීමනාව අයකර ගැනීමට කටයුතු කරගෙන නොතිබුණි.

(ඊ) පානදුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ යලි විවාහ වූ සන්නද්ධ හමුදා වැන්දඹු විශ්‍රාම වැටුප් අංක 40-981702 දරන ගොනුවේ ඇතුළත්ව තිබූ 2015 ජූනි 11 දිනැති ප්‍රධාන පත්‍රයට අනුව ගෙවිය යුතු මාසික වෙනත් දීමනාව රු.1,750 ක් වුවද 2012 දෙසැම්බර් 19 සිට විගණිත දිනය දක්වාම මාසිකව රු.4,250 බැගින් ගෙවා තිබීම හේතුවෙන් රු.504,000 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(උ) මහර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාමිකයින් 03 දෙනෙකු සඳහා හමුදා වැන්දඹු විශ්‍රාම වැටුප් 01/2019 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය අනුව සංශෝධනය වී නොතිබුණි.

**4.3.2 රාජ්‍ය සේවක විශ්‍රාම ප්‍රතිලාභ හා වැන්දඹු හා අනත්දරු හා වැන්දඹු පුරුෂ හා අනාතුදරු ප්‍රතිලාභ හිමිගැන්වීම**

(අ) පානදුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාම වැටුප් අංක 21-900030 ට (645050207v) අදාළ මූලික වැටුප හා අන්තර් දීමනාව පිළිවෙලින් රු.6,286 ක් හා රු.2,875 ක් ලෙස පැවතීම හා මෙම විශ්‍රාම වැටුපට සමගාමීව (බෙදී ගෙවන විශ්‍රාම වැටුප) නොච්චියාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් 2020 ජනවාරි මාසය දක්වා ගෙවීම් කළ 23-900029 (937890656v) දරන විශ්‍රාම වැටුප් මූලික වැටුප හා අන්තර් දීමනාව පිළිවෙලින් රු.5,373 ක් හා 1,750 ක් ලෙස වෙනස් අගයක් පැවතීමට හේතු විගණනයට අනාවරණය කරගත නොහැකි විය. තව ද 23-900029 දරන විශ්‍රාම වැටුප හිමිකම් ලැබූ අනත්දරුවාගේ වයස 2020 ජනවාරි මස සම්පූර්ණ වී තිබුණ ද එම කොටස 21-900030 දරන විශ්‍රාම වැටුපට එකතු කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) පානදුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2013 සැප්තැම්බර් 20 දිනැති 3/2013 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය ප්‍රකාරව නැවත විවාහ වූ වැන්දඹුවන්ට අන්තර් දීමනාවෙන් සියයට 50 ක් ගෙවිය යුතු වුවද විශ්‍රාම වැටුප් අංක 22-1000004 දරන වැන්දඹුවට

පිටුව 16 | 17

2014 දෙසැම්බර් මස සිට 2020 ඔක්තෝබර් මස දක්වා සම්පූර්ණ අන්තර් දීමනාවම ගෙවීම හේතුවෙන් අන්තර් දීමනාව රු.122,250ක් වැඩිපුර ගෙවීම් කර තිබුණි.

(ඇ) විශ්‍රාමිකයින්ගේ මරණය ග්‍රාම නිලධාරීන් තහවුරු නොකිරීම, ජීවිත සහතික ඉදිරිපත් නොකිරීම වැනි විවිධ හේතු මත ගෙවීම අත්හිටුවන ලද පානදුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාමිකයින් 10 දෙනෙකුගේ විශ්‍රාම වැටුප් ගෙවීම් අත්හිටුවා මාස 35-107 අතර කාලයක් ගත වී තිබුණ ද වැඩිපුර ගෙවීමක් සිදු වී ඇත් ද යන්න හෝ ගෙවීම් අත්හිටු වීමට නිවැරදි හේතුව පිළිබඳව පසුවිපරම් කිරීමක් සිදුකර නොතිබුණි .

(ඈ) වයස අවුරුදු 18 ඉක්මවූ පානදුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අනත්දරුවන් 04 දෙනෙකුගේද, මහර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අනත්දරුවන් 03 දෙනෙකුගේද විශ්‍රාම වැටුප් සෘජුවම අනත්දරුවන් වෙත ගෙවීමකින් තොරව භාරකාරීත්වය යටතේ ගෙවමින් පවතින බව නිරීක්ෂණය විය .

(ඉ) පානදුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාමිකයින් 11 දෙනෙකු වෙනුවෙන් එකම පුද්ගලයා වෙනුවෙන් ගෙවන වැන්දඹු විශ්‍රාම වැටුප් හා යැපීම් දීමනා / වන්දි විශ්‍රාම යන වැටුප් වර්ග දෙක සඳහාම ජීවන වියදම් දීමනාව ගෙවීම් කර තිබුණි.

(ඊ) මාස්පොත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ එකම පුද්ගලයා වෙනුවෙන් ගෙවෙන 1-885548 හා 21-2184749 (435130569V) දරන විශ්‍රාම වැටුප් 02 වෙනුවෙන් ජීවන වියදම් දීමනාව පිළිවෙලින් මාසිකව රු. 6,025 ක් හා රු. 2,000 ක් වශයෙන් ගෙවෙන බව විගණනයට නිරීක්ෂණය වූ අතර වෙනස් අගයන් ගෙවීමට හේතු අනාවරණය නොවුණි.

(උ) 2022-2024 කාල පරිච්ඡේදය තුළ ආණමඩුව,ආරච්චිකට්ටුව, හා පුත්තලම ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත විශ්‍රාමිකයින් 10 දෙනෙකුගේ මියයාම් නිසි පරිදි වාර්තා නොවීම හේතුවෙන් රු. 387,783ක විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවීම් කර තිබුණි.

## 5. තිරසාර සංවර්ධනය

### 5.1 තිරසර සංවර්ධන අරමුණු හඳුනා ගැනීම

වසර 2030 දී ඉටුකර ගැනීමට ඉලක්ක කර ඇති තිරසාර සංවර්ධනය සඳහා වන අරමුණු යටතේ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් එක් අරමුණක් පමණක් හඳුනාගෙන තිබුණි. එම අරමුණ සම්බන්ධයෙන් ද පැහැදිලි ඉලක්ක පිහිටුවා නොමැති අතර පාදක දත්ත හා ප්‍රගතිය මැන බැලීමේ දර්ශක ක්‍රමවත්ව පිහිටුවීමක් සිදුකර නොතිබුණි. තිරසාර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා ආයතනයේ කාර්යභාර්ය හා සම්බන්ධ වන උනන්දුවක් දක්වන පාර්ශවයන් ද හඳුනාගෙන නොතිබුණි.

එච්.එම්. ද සොයිසා
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටුව 17 | 17

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. LSW/E/LGPF/25/01 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2025 මැයි 27 දින

විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්,
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව.

**පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදලේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (1) වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය වියාචනය**

පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදලේ 2024 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන සේවා ආඥා පනතේ (264 අධිකාරියේ) 62 වගන්තිය, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාවේ ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය වියාචනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

**1.2 මතය වියාචනය සඳහා පදනම**

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිති අංක 01 ප්‍රකාරව අරමුදල විසින් උපචිත පදනම මත ගිණුම් තැබිය යුතු වුවද, සමාලෝචිත වර්ෂයේදී පූර්ව වර්ෂවලට අදාලව හා සමාලෝචිත වර්ෂයට අදාලව ලැබී තිබූ රු.73,002,313ක දායක මුදල මුදල් පදනමට ගිණුම් ගත කර තිබුණි.

(ආ) භාණ්ඩාගාර ප්‍රතිපාදන යොදා ගනිමින් 2024 වර්ෂයේ විශ්‍රාමිකයින් සඳහා රු.913,923,665ක දායක මුදල් ගෙවා තිබුණි. පළාත් පාලන ආයතන වලින් වර්ෂය තුළ දායක මුදල් ලැබීම් රු.73,002,313ක් වූ අතර විශ්‍රාම වැටුප් අරමුදලින් ගෙවීම් ලෙස එම මුදල දායක මුදල් ලැබීමට එරෙහිව ගිණුම් ගතකර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ සමස්ත ලැබීම් රු.73,002,313කින් රු.14,732,111ක් ඉකුත් වර්ෂ සඳහා ලැබීම් වුවත් එම වටිනාකම, ඌනතාවය සමුච්චිත අරමුදලට මාරුකිරීම ලෙස ආදායම් වියදම් ගිණුමට ගලපා තිබුණි.

(ඈ) මූල්‍ය ප්‍රකාශන අනුව 2024 දෙසැම්බර් 31 දිනට පළාත් පාලන ආයතන 164කින් ලැබිය යුතු දායක මුදල රු.856,093,490 ක් වුවත් පළාත් පාලන ආයතනයන්හි මූල්‍ය ප්‍රකාශන අනුව ගෙවිය යුතු දායක මුදල රු.156,162,270 ක් ලෙස අඩුවෙන් දැක්වීම හේතුවෙන් රු.699,931,220 ක වෙනසක් නිරීක්ෂණය විය.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

(ඉ) මූල්‍ය ප්‍රකාශන අනුව 2024 දෙසැම්බර් 31 දිනට පළාත් පාලන ආයතන 33 කට අදාල ලැබිය යුතු දායක මුදල රු.101,640,065 ක් වුවත් පළාත් පාලන ආයතනයන්හි මූල්‍ය ප්‍රකාශන අනුව ගෙවිය යුතු දායක මුදල රු.107,596,345 ක් ලෙස වැඩියෙන් දැක්වීම හේතුවෙන් රු.5,956,280ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඊ) 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව පළාත් පාලන ආයතන 303කින් රු.1,053,748,746 ක් වූ ලැබිය යුතු දායක මුදල් තුළ පළාත් පාලන ආයතන 62 කට අදාළව රු.429,754,794ක ලැබිය යුතු දායක මුදල් සඳහා ශේෂ තහවුරු කිරීම් ලැබී නොතිබුණි.

ඉහත විස්තර කර ඇති පරිදි, ශේෂ පත්‍රයේ, ආදායම් හා වියදම් ගිණුමේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ඇතුලත් ප්‍රමාණාත්මක අයිතම විකල්ප ක්‍රම මගින් තහවුරු කිරීමට හෝ සත්‍යාපනය කිරීමට මට නොහැකි විය. මෙ හේතුවෙන් ශේෂ පත්‍රය, ආදායම් හා වියදම් ගිණුම සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සැකසෙන වටිනාකම් හෝ අයිතමයන්වල වාර්තාගත හෝ වාර්තා නොකළ වටිනාකම් හෝ ගනුදෙනු සම්බන්ධයෙන් කිසියම් ගැලපීමක් කිරීමට අවශ්‍ය දැයි මට නිශ්චය කිරීමට නොහැකි විය.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය වියාචනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

**2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

පිටුව 2 | 3

ජාතික විගණන කාර්යාල
தேசிய கணக்காய்வு அலுவலக
NATIONAL AUDIT OFFIC
NAOSL

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ මතය වියාචනය සඳහා පදනම කොටසේ (අ) සිට (උ) දක්වා ඇති නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 07/2016 අනුව 2016 අයවැය යෝජනා අංක 425 හා 426 මගින් පාර්ලිමේන්තුවේ පිළිගත් ක්‍රියාදාමයකට අනුකූලව සියලුම ව්‍යවස්ථාපිත හා ව්‍යවස්ථාපිත නොවන අරමුදල් පාර්ලිමේන්තු පාලනයට යටත් කිරීම සහතික කිරීම පිණිස මහා භාණ්ඩාගාරය විසින් 2016 ජුනි 11 දින විශේෂ කමිටුවක් පත් කර තිබූ අතර එම කමිටුව විසින් මෙම අරමුදලට අදාල පනත් සංශෝධනය කර වසා දැමිය යුතු බවට යෝජනා කර තිබුණද ඒ සම්බන්ධයෙන් තීරණයක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද එම වාර්තාවේ හිඟ දායක මුදල් අදාල ආයතන වෙතින් ඉක්මනින් අය කර ගැනීමට කටයුතු කරන ලෙස දක්වා තිබූ නිර්දේශයද ක්‍රියාත්මක කර නොතිබුණි.

**3.2. ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

(අ) මූල්‍ය ප්‍රකාශන අනුව පලාත් පාලන ආයතන 303 කින් 2024 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුළු දායක මුදල් ශේෂය රු.1,053,748,746 වූ අතර එම දායක මුදල් ශේෂයෙන් ආයතන 74 ක කාර්තු වශයෙන් ලබා ගත යුතු රු.283,979,179 ක ශේෂයක් සමාලෝචිත වර්ෂය තුලදී ලබා ගැනීමට අරමුදල අපොහොසත් වී තිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශන අනුව පලාත් පාලන ආයතන 50 කින් 2024 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු දායක මුදල රු.988,462,216ක් වුවත් පළාත් පාලන ආයතන මූල්‍ය ප්‍රකාශනයන්හි ගෙවිය යුතු දායක මුදලක් නොමැති බව නිරීක්ෂණය විය.

(ඇ) මූල්‍ය ප්‍රකාශන අනුව 2024 දෙසැම්බර් 31 දිනට පළාත් පාලන ආයතන 05 ක ලැබිය යුතු දායක මුදල් ශේෂයක් නොමැති වුවත් අදාළ පළාත් පාලන ආයතනවල මූල්‍ය ප්‍රකාශන අනුව එකතුව රු.538,508ක ගෙවිය යුතු දායක මුදල් ශේෂයන් ලෙස දක්වා තිබුණි.

**3.3. කළමනාකරණ ක්‍රියාකාරකම්**

(අ) ලැබීම් ගෙවීම් සාරාංශයෙහි පෙර වර්ෂ සඳහා ලැබීම් ද ඇතුළුව සමස්ත ලැබීම් ඇතුලත් වුවද වර්ග කිරීමෙන් තොරව සමාලෝචිත වර්ෂය සඳහා ලැබීම් ගෙවීම් ලෙස සටහන් කර තිබුණි.

(ආ) පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදල යටතේ 2015 වර්ෂයේ සිට සාමාජිකයන්ගේ නාම ලේඛනයක් පවත්වා ගෙන ගියද එම නාම ලේඛණයේ මිය යන විශ්‍රාමිකයින්ගේ නම් ඉවත් කර සාමාජිකයන්ගේ නාම ලේඛනය පවත්වාගෙන යාමට කටයුතු කර නොතිබුණි.

පී.එච්.ඩී. ධර්මපාල
විගණකාධිපති (වැ.බ.)

පිටුව 3 | 3

# ජාතික විගණන කාර්යාලය
## தேசிய கணக்காய்வு அலுவலகம்
## NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } එල්එස්ඩබ/පි/විවර්ස් /25/01  ඔබේ අංකය / உமது இல. / Your No. }  දිනය / திகதி / Date } 2025 මැයි 20 දින

26 MAY 2025

විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්,
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

**ගුරු වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (1) වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ගුරු වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලේ 2024 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත, 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1953 අංක 44 දරන පාඨශාලීය ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් ආඥා පනතේ 5 හා 9 වගන්ති ප්‍රකාර පනවන ලද රෙගුලාසිවල 6(1) වගන්තිය, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

(අ) කොළඹ අධ්‍යාපන කලාපයේ සමාලෝචිත වර්ෂයේ අප්‍රේල් මාසයට අදාළ දායක මුදල් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළින් අත්හැරී තිබුණු බැවින් ආදායම් වියදම් ගිණුමේ වර්ෂයට අදාල දායක මුදල රු.4,035,793 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) 2024 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු දායක මුදල් ශේෂයෙහි කළුතර අධ්‍යාපන කලාපයට අයත් දෙසැම්බර් මාසයට අදාල ලැබීම් දෙවරක් සටහන් වීමෙන් ශේෂ පත්‍රයේ ලැබිය යුතු දායක මුදල් ශේෂය රු.122,104 කින් වැඩියෙන් දක්වා තිබුණි.

පිටුව 1 | 4

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව  இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை  No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34  +94 11 2 88 72 23  ag@auditorgeneral.gov.lk  www.naosl.gov.lk

(ඇ) 2024 වර්ෂයේ කේරි විද්‍යාලයෙන් අගෝස්තු මාසය සඳහා දායක මුදල් ලැබී නොතිබුණු අතර 2024 දෙසැම්බර් 31 දිනට එම හිඟ දායක මුදල් ගණනය කර ලැබිය යුතු දායක මුදල් ශේෂයට ඇතුළත් කර නොතිබුණි.

(ඈ) වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් දායකත්වය සියයට 8 දක්වා ඉහළ නංවා තිබුණද, කළුතර අධ්‍යාපන කලාපයේ එක් බාලිකා විදුහලක 2024 අප්‍රේල් සිට දෙසැම්බර් දක්වාත් තවත් විදුහලක 2024 අප්‍රේල් සිට සැප්තැම්බර් දක්වාත් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් දායකත්වයට සියයට 6 ක දායකත්වයක් පමණක් ලබා දී තිබුණි. මේ නිසා විදුහල් දෙකට අදාල හිඟ දායක මුදල් එකතුව රු.347,375 ක්වූ අතර 2024 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු දායක මුදල් ශේෂයට එය ගලපා නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේනම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

පිටුව 2 | 4

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

**2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ 1.2 හි දක්වා ඇති නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1. නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

| නීති,රීති රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| 1953 අංක 44 දරන පාඨශාලීය ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් පනත | |
| (i) නියෝග අංක 04 | ගුරු වැන්දඹු දායක මුදල් වලින් අරමුදලක් ගොඩනහා එමඟින් ගුරු වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම් කල යුතු වුවද, දායක මුදල් රැස් කිරිම හා ගෙවීම් කිරිම සඳහා අරමුදල වෙනුවෙන් වෙනම බැංකු ගිණුමක් පවත්වා නොගෙන විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ බැංකු ගිණුමට දායක මුදල් රැස්කර තිබුණු අතර විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු වැය ශීර්ෂය යටතේ ගෙවීම් කර තිබුණි. |
| (ii)නියෝග අංක 9(අ) | එක් එක් දායක මුදල් ගෙවීමට සුදුසුකම් ලැබූ හා දායක මුදල් ගෙවන්නන් පිළිබඳ තොරතුරු ඇතුළත් ලේඛනයක් පවත්වා නොතිබුණි. |

**3.2 කළමනාකරණ ක්‍රියාකාරකම්**

(අ) සාමාජිකයන්ගේ නම, පාසල, ඇතුළත් ලේඛනයක් නඩත්තු නොකිරීම හේතුවෙන් අරමුදලට වාර්ෂිකව සත්‍ය වශයෙන්ම ලැබිය යුතු මුදල, ලැබූ මුදල හා හිඟ මුදල්, අරමුදලේ සාමාජික සංඛ්‍යාව,සමාලෝචිත වර්ෂයේ නව සාමාජිකත්වය ලබාගත් සංඛ්‍යාව හා අරමුදලේ සාමාජිකත්වයෙන් ඉවත් වූ සංඛ්‍යාව පිළිබඳව තොරතුරු නිවැරදිව හඳුනාගැනීමට නොහැකි වී තිබුණි.

(ආ) අරමුදලේ අරමුණු ඒකාබද්ධ අරමුදලේ 253 දරන විසර්ජන ශීර්ෂයෙන් ඉටුවන බැවින්, මෙම අරමුදල අත්‍යවශ්‍ය නොවුවද අරමුදලට අදාල පනත් සංශෝධනය කළයුතු බවට යෝජනා වී තිබුණද එම යෝජනාව මෙතෙක් ඉටුවී නොතිබුණි.

(ඇ) දායක මුදල් හා වෙනත් ආදායම් රැස්කිරීම් සහ දායක මුදල් ආපසු ගෙවීම් සඳහා අවසන් ගිණුමෙහි භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ ගිණුම පවත්වාගෙන ගොස් තිබුණ ද, 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන තුල දක්වා තිබූ රු. 3,792,866,171 ක භාණ්ඩාගාර ලේකම්ගේ ශේෂය නාමික ශේෂයක් වන අතර ඒ බව ගිණුම් සටහන් මඟින්ද දක්වා තිබුණි.

ජී.එච්.ඩී. ධර්මපාල
විගණකාධිපති (වැ.බ.)

පිටුව 4 | 4

# ජාතික විගණන කාර්යාලය
## தேசிய கணக்காய்வு அலுவலகம்
## NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } LSW/E/PSPF/25/01

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2025 ජූනි 9 දින

විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්,
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව.

**රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (1) වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය වියාචනය

රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1942 අංක 18 දරන රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ආඥා පනතේ (621 අධිකාරියේ) 24(1) වගන්තිය, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය වියාචනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

### 1.2 මතය වියාචනය සඳහා පදනම

(අ) මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා තිබූ රු.221,002,161 ක් වූ ලැබිය යුතු රජයේ දායක මුදල් තහවුරු කර ගැනීමට අදාල උපලේඛන විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි..

(ආ) එක් එක් දායකයා අනුව වෙන් කළ හැකි පරිදි කේවල ශේෂ උපලේඛන ඉදිරිපත් කර නොතිබූ බැවින් අනිවාර්ය දායක මුදල් ගිණුමේ රු.39,823,808,149 ක ශේෂය හා රජයේ දායක මුදල් ගිණුමේ රු.61,194,695,013 ක ශේෂයෙහි නිවැරදිතාවය තහවුරු නොවුණි.

(ඇ) ස්වේච්ඡා දායක මුදල් ගිණුමේ රු.61,535,259 ක් වූ ශේෂය සම්බන්ධයෙන් හිමිකම් ලබන්නන්ගේ තොරතුරු සහිත උපලේඛන විගණනයට ඉදිරිපත් නොවූ බැවින් එම ශේෂයෙහි නිවැරදිතාවය තහවුරු නොවුණි.



අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34
+94 11 2 88 72 23
ag@auditorgeneral.gov.lk
www.naosl.gov.lk

(ඇ) 1989 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එනු ලබන ගැලපුම් ගිණුමේ ශේෂය තුළ ඇතුළත් රු.5,644,476 ක ශේෂය, හඳුනා නොගත් ශේෂයක් ලෙස දක්වා තිබුණද එම ශේෂය නිශ්චිතව හඳුනාගෙන අදාල ගිණුම් වලට අවශ්‍ය ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ රු. 43,650,259,791ක් වූ භාණ්ඩාගාර බැඳුම්කර සඳහා 2024 දෙසැම්බර් 31 දිනට උපචිත පොළී ආදායම රු.1,309,507,797ක් අඩුවෙන් ගිණුම් ගත කර තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේදී ස්ථාවර තැන්පතු දෙකකට අදාල පොළී ආදායම රු.27,669,000ක් වැඩියෙන් දක්වා තිබුණි.

ඉහත විස්තර කර ඇති පරිදි, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ,හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ඇතුලත් ප්‍රමාණාත්මක අයිතම විකල්ප ක්‍රම මගින් තහවුරු කිරීමට හෝ සත්‍යාපනය කිරීමට මට නොහැකි විය.මේ හේතුවෙන්, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය , සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සැකසෙන වටිනාකම් හෝ අයිතමයන් වල වාර්තාගත හෝ වාර්තා නොකළ වටිනාකම් හෝ ගනුදෙනු සම්බන්ධයෙන් කිසියම් ගැලපීමක් කිරීමට අවශ්‍ය දැයි මට නිශ්චය කිරීමට නොහැකි විය.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය වියාචනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

පිටුව 2 | 3

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.
- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ මතය වියාවනය සඳහා පදනම කොටසේ (අ) සිට (ළ) දක්වා ඇති නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1. නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

1942 රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් පනතේ 25 වන වගන්තිය ප්‍රකාරව එක් එක් මුදල් වර්ෂය අවසාන වීමෙන් පසු විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂක විසින් එම දිනයේ දී අරමුදලේ තමාගේ නමින් බැරට පවත්නා මුළු මුදල් ප්‍රමාණය එක් එක් දායකයා වෙත දැනුම් දිය යුතු වුවත් එම අවශ්‍යතාවය ඉටු කිරීමට කටයුතු කර නොතිබුණි.

3.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

දායකයින් අතර රු.13,278,434,296 ක් වූ පොළී ආදායම විභජනය කිරීම සඳහා ආරම්භක මාසික වෙන් කිරීම් වටිනාකමෙන් සාමාන්‍ය අගයක් පදනම් කොටගෙන අනුපාතය තීරණය කර තිබුණු අතර එමඟින් පොළී ආදායම දායකයින් අතර සම්පූර්ණයෙන් බෙදියාමක් සිදු නොවන බව නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ දී රු.5,074,001,808ක්වූ පොළී ආදායමක් දායකයින් අතර නොබෙදා පොදු සංචිතයට මාරුකර තිබුණි.

ජී.එච්.ඩී.ධර්මපාල
විගණකාධිපති (වැ.බ)

පිටුව 3 | 3

## 04.
## කාර්ය සාධන දර්ශක

### 4.1. ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

| ක්‍රියාකාරකම | උප ක්‍රියාකාරකම | කාර්ය සාධන දර්ශක | ඇස්තමේන්තුගත ප්‍රමාණය | අපේක්ෂිත නිමවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | 100%-90% | 75%-89% | 50%-74% | 49% ට අඩු |
| නව විශ්‍රාම වැටුප් ප්‍රදානය | විශ්‍රාම වැටුප් ප්‍රදානය - විමධ්‍යගත | 2024 වර්ෂයේ විශ්‍රාම වැටුප් ප්‍රදාන ලබාගත් විශ්‍රාමිකයින් ගණන | 30,000 | 102.7% | - | - | - |
| | විශ්‍රාම වැටුප් ප්‍රදානය-මධ්‍යගත | | 2,400 | - | 75% | - | - |
| | වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ප්‍රදානය | | 9,000 | 104.53% | - | - | - |
| සංශෝධන ගෙවීම් | විශ්‍රාම වැටුප් සංශෝධන - විමධ්‍යගත | ගෙවූ සංශෝධිත විශ්‍රාම වැටුප් ප්‍රමාණය | 3,600 | - | - | - | 47.17% |
| | විශ්‍රාම වැටුප් සංශෝධන - මධ්‍යගත | | 780 | - | - | - | 35.77% |
| පාර්තෝෂික හා වෙනත් ගෙවීම් | මරණ පාර්තෝෂික | මරණ පාරිතෝෂික ගෙවන ලද අයඳුම්පත් සංඛ්‍යාව | 1,250 | 110.96% | - | - | - |
| | ආබාධිත විශ්‍රාම වැටුප් | ගෙවූ ආබාධිත විශ්‍රාම වැටුප් සංඛ්‍යාව | 10,000 | - | 80.36% | - | - |
| | සත්කාර පියස | සම්මුඛ පරීක්ෂණයට කැඳවන ලද සංඛ්‍යාව | 30,000 | 109.93% | - | - | - |
| මාසික විශ්‍රාම වැටුප් | මාසික විශ්‍රාම වැටුප් - සිවිල් | මාසිකව ප්‍රතිලාභ ලද විශ්‍රාමිකයින් ගණන | 515,214*12 | 99.88% (මූල්‍ය ප්‍රගතිය) | - | - | - |
| | පාර්තෝෂික ගෙවීම | මාසිකව ප්‍රතිලාභ ලද විශ්‍රාමිකයින් ගණන | - | 99.29% (මූල්‍ය ප්‍රගතිය) | - | - | - |
| සමාජ සුභසාධන | ත්‍රිවිධ හමුදා සහ පොලිස් | මාසිකව ප්‍රතිලාභ ලද පුද්ගලයින් ගණන | 41,126*12 | 99.67% (මූල්‍ය ප්‍රගතිය) | - | - | - |

## කාර්ය සාධන දර්ශක

| ක්‍රියාකාරකම | උප ක්‍රියාකාරකම | කාර්ය සාධන දර්ශක | ඇස්තමේන්තුගත ප්‍රමාණය | අපේක්ෂිත නිමවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | 100%-90% | 75%-89% | 50%-74% | 49% ට අඩු |
| වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම | මාසිකව ප්‍රතිලාභ ලද පුද්ගලයින් ගණන | 187,492*12 | 96.90% (මූල්‍ය ප්‍රගතිය) | - | - | - |
| දුම්රිය බලපත්‍ර | විශ්‍රාමිකයින් සඳහා දුම්රිය බලපත්‍ර නිකුත් කිරීම | මාසිකව ප්‍රතිලාභ ලද පුද්ගලයින් ගණන | | - | - | 60.65% (මූල්‍ය ප්‍රගතිය ) | - |
| විදේශ විශ්‍රාම වැටුප් ගෙවීම | සිවිල් විශ්‍රාම වැටුප්, විදේශීය සිවිල් විශ්‍රාම වැටුප් බවට පරිවර්තනය කිරීම | විශ්‍රාමිකයින් හා වැන්දඹුවන් සංඛ්‍යාව | 450 | - | - | 62% | - |
| | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප්, විදේශීය වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් බවට පරිවර්තනය කිරීම | | 180 | - | - | 51% | - |
| | හමුදා විශ්‍රාම වැටුප් විදේශ හමුදා විශ්‍රාම වැටුප් බවට පරිවර්තනය කිරීම | | 200 | - | 80% | - | - |
| | විදේශයන්හි වෙසෙන ශ්‍රී ලාංකිකයන්ගේ නව වැන්දඹු විශ්‍රාම වැටුප් විවෘත කිරීම | | 120 | - | - | 60% | - |
| හිඟ විශ්‍රාම වැටුප් ගෙවීම (විදේශගත විශ්‍රාමිකයින් සඳහා) | 14/2019 චක්‍රලේඛය අනුව අඩු නොකල විශ්‍රාම වැටුප් ගෙවීම | මාසිකව ප්‍රතිලාභ ලද විශ්‍රාමිකයින් ගණන | 180 | - | - | - | 30% |
| හිඟ විශ්‍රාම වැටුප් ගෙවීම (විදේශගත විශ්‍රාමිකයින් සඳහා) | විශේෂ කමිටු අනුමැතිය මත රු.750,000 - 1,500,000 දක්වා වටිනාකමක් සහිත හිඟ ගෙවීම | මාසිකව ප්‍රතිලාභ ලද විශ්‍රාමිකයින් ගණන | 150 | - | 76% | - | - |

| ක්‍රියාකාරකම | උප ක්‍රියාකාරකම | කාර්ය සාධන දර්ශක | ඇස්තමේන්තු ගත ප්‍රමාණය | අපේක්ෂිත නිමවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | 100%- 90% | 75%- 89% | 50%- 74% | 49% ට අඩු |
| හිඟ විශ්‍රාම වැටුප් ගෙවීම (විදේශගත විශ්‍රාමිකයින් සඳහා) | විශේෂ කමිටු අනුමැතිය මත රු.1,500,000/= ට වැඩි වටිනාකමක් සහිත හිඟ මුදල් ගෙවීම | මාසිකව ප්‍රතිලාභ ලද විශ්‍රාමිකයින් ගණන | 90 | - | - | - | 32.22% |
| විදේශ විශ්‍රාමිකයින් ගේ වාර්ෂික ජීවිත සහතික යාවත්කාලීන කිරීම | 2024 වාර්ෂික ජීවිත සහතික යාවත්කාලීන කිරීම | මාසිකව ප්‍රතිලාභ ලද විශ්‍රාමිකයින් ගණන | 8,000 | 103% | - | - | - |
| ඩෝල (Dalor) ලිපි නිකුත් කිරීම | | මාසිකව ප්‍රතිලාභ ලද විශ්‍රාමිකයින් ගණන | 200 | 98% | - | - | - |
| දුම්රිය බලපත්‍ර නිකුත් කිරීම(විදේශ විශ්‍රාමිකයින් සඳහා) | | මාසිකව ප්‍රතිලාභ ලද විශ්‍රාමිකයින් ගණන | 200 | - | - | - | 32% |
| දත්ත පද්ධති යාවත්කාලීන කිරීම (Deaths, transfer to DS, status changes, ect…) | | | 480 | - | 88.75% | - | - |
| හිඟ විශ්‍රාම වැටුප් ගෙවීම | සිවිල්<br>හමුදා<br>විෂමතා | විශ්‍රාමිකයින් ගණන | 8,500 | 141.6% | - | - | - |
| වැන්දඹු හා අනත්දරු දායක මුදල් ආදායම | මධ්‍යම රජය | මාසික අදායම | 29,000* | - | 84.84% | - | - |
| | පළාත් සභා | මාසික අදායම | 17,000* | 94.6% | - | - | - |
| | ගුරු වැන්දඹු අනත්දරු | මාසික අදායම | 427* | 122.25% | - | - | - |

## කාර්ය සාධන දර්ශක

| ක්‍රියාකාරකම | උප ක්‍රියාකාරකම | කාර්ය සාධන දර්ශක | ඇස්තමේන්තු ගත ප්‍රමාණය | අපේක්ෂිත නිමවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | 100%-90% | 75%-89% | 50%-74% | 49% ට අඩු |
| වැන්දඹු හා අනත්දරු දායක මුදල් ආපසු ගෙවීම | සිවිල් | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 1,300 | 130.15% | - | - | - |
| | හමුදා | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 1,200 | 250% | - | - | - |
| | ගුරු වැන්දඹු අනත්දරු | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 35 | 174.29% | - | - | - |
| | පොදු 29 | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 30 | - | - | 56.67% | - |
| රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල | රා.සේ.අ.අ. සාමාජිකයින් සංඛ්‍යාව | වාර්ෂික නව සාමාජිකයින් සංඛ්‍යාව | 11,520 | - | - | - | 38.98% |
| | දායක මුදල් ගෙවීම් | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 5,400 | - | 84.17% | - | - |
| | දායක මුදල් ලැබීම් | මාසික දායකත්වය 8% හා 12% | 1,480* | - | - | 51.89% | - |
| | ආයෝජන | වර්ෂය තුල සිදු කරන ලද නව ආයෝජන | 12,000* | - | 87.35% | - | - |
| මානව සම්පත් සංවර්ධනය | ධාරිතා සංවර්ධනය | පුහුණු සැලැස්මට අනුව පුහුණු වැඩසටහන් පැවැත්වීම | 27 පුහුණු වැඩසටහන් | 103.7% | - | - | - |
| දෘඩාංග පහසුකම් සංවර්ධන කටයුතු | දෘඩාංග මිලදී ගැනීම | පරිගණක | 100 | - | - | 66% | - |
| | | ස්කෑන් යන්ත්‍ර | 50 | 104% | - | - | - |
| | | මුද්‍රණ යන්ත්‍ර | 50 | 100% | - | - | - |
| සේවා ගිවිසුම් | Mail Server Upgrade | සේවා ගිවිසුම | 01 | 100% | - | - | - |
| | Firewall Renawal | සේවා ගිවිසුම | 01 | 100% | - | - | - |
| | DMS පද්ධතිය | සේවා ගිවිසුම | 01 | 100% | - | - | - |
| මෘදුකාංග සංවර්ධනය | විශ්‍රාම වැටුප් අයදුම්පත්‍ර සහ ගෙවීම් කළමනාකරණ මොඩියුල නැවත සකස් කිරීම | | - | - | - | - | 28% |

| ක්‍රියාකාරකම | උප ක්‍රියාකාරකම | කාර්ය සාධන දර්ශක | ඇස්තමේන්තු ගත ප්‍රමාණය | අපේක්ෂිත නිමවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | 100%-90% | 75%-89% | 50%-74% | 49% ට අඩු |
| පද්ධති ආරක්ෂාව | Cert | සේවා ගිවිසුම් | 01 | 100% | - | - | - |
| ප්‍රාග්ධන වත්කම් පුනරුත්තාපනය හා වැඩිදියුණු කිරීම | දෙපාර්තමේන්තු පරිශ්‍ර සංවර්ධනය | 2024 වර්ෂය තුල සියළුම ව්‍යාපෘති අවසන් කිරීම | | 100% | - | - | - |
| | රම්බොඩ හා කැළණිය නිවාඩු නිකේතනය නවීකරණය කිරීම | | | - | - | - | - |
| | වාහන | | | - | - | - | 20% |
| | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | | | 100% | - | - | - |
| ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම | ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ | | අවශ්‍යතාව පරිදි | 100% | - | - | - |
| | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | | අවශ්‍යතාව පරිදි | 100% | - | - | - |
| | කල්බදු වාහන | | 01 | 100% | - | - | - |
| අභ්‍යන්තර විගණන කටයුතු | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | | 01 | 100% | - | - | - |
| | විගණන කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම | | 4 | 100% | - | - | - |
| | ප්‍රාදේශීය ලේකම් කාර්යාල විගණන පරීක්ෂණ | | 6 | 200% | - | - | - |
| | රු.ලක්ෂ 15ට වැඩි විශ්‍රාම වැටුප් ලිපිගොනු පරීක්ෂාව | | 300 | 147% | - | - | - |
| අභ්‍යන්තර විගණන කටයුතු | විශේෂ විමර්ශන (අවශ්‍යතාව පරිදි) | | 4 | - | 75% | - | - |
| | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර අංශ විගණනය කිරීම | | 6 | - | - | 67% | - |
| | මධ්‍යම දත්ත පද්ධතිය සමාලෝචනය (ප්‍රා.ලේ.කො අනුව) | | 100 | - | 84% | - | - |

## කාර්ය සාධන දර්ශක

| ක්‍රියාකාරකම | උප ක්‍රියාකාරකම | කාර්ය සාධන දර්ශක | ඇස්තමේන්තු ගත ප්‍රමාණය | අපේක්ෂිත නිමවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | 100%-90% | 75%-89% | 50%-74% | 49% ට අඩු |
| අභ්‍යන්තර විගණන කටයුතු | වෙනත් විගණන කාර්යයන් | | 200 | - | 75% | - | - |
| ප්‍රතිපත්ති හා විමර්ශන කටයුතු | අනියම්, ආදේශක, තාවකාලික, කොන්ත්‍රාත්, සහන, උපාධිධාරී අභ්‍යාසලාභී, පුහුණු, ත්‍රිවිධ හමුදා සේවා කාල විශ්‍රාම වැටුප ගණනයට අදාළ කර ගැනීම සඳහා අනුමැතිය ලබා දීම | අනුමැතිය ලබා දුන් ගොනු සංඛ්‍යාව | 480 | - | 76.67 % | - | - |
| | මහජන පෙත්සම් කාරක සභාව වෙත ඉදිරිපත් වූ පෙත්සම්වලට අදාළව නිර්දේශ වාර්තා යොමු කිරීම | ඉදිරිපත් කරන ලද වාර්තා සංඛ්‍යාව | 48 | 100% | - | - | - |
| | පාර්ලිමේන්තු වාචික පිළිතුරු අපේක්ෂිත ප්‍රශ්න සඳහා ලබා දීමට නිර්දේශිත පිළිතුරු සකස් කර ඉදිරිපත් කිරීම | යොමු කරන ලද පිළිතුරු සංඛ්‍යාව | 24 | 100% | - | - | - |
| | අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා වෙත ගරු මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන ලද යෝජනා සඳහා නිරීක්ෂණ/ නිර්දේශ ඇතුළත් වාර්තා සකස් කර යොමු කිරීම | යොමු කරන ලද වාර්තා සංඛ්‍යාව | 12 | 100% | - | - | - |

| ක්‍රියාකාරකම | උප ක්‍රියාකාරකම | කාර්ය සාධන දර්ශක | ඇස්තමේන්තු ගත ප්‍රමාණය | අපේක්ෂිත නිමවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | 100%-90% | 75%-89% | 50%-74% | 49% ට අඩු |
| ප්‍රතිපත්ති හා විමර්ශන කටයුතු | ආංශික අධීක්ෂණ කාරක සභා විසින් යොමු කරන කරුණු සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම හා ඊට අදාළ නිර්දේශ සකස් කර ඉදිරිපත් කිරීම | යොමු කරන ලද වාර්තා සංඛ්‍යාව | 24 | 100% | - | - | - |
| | විශ්‍රාමිකයින්ගේ ගැටළු සම්බන්ධයෙන් විශ්‍රාමික සංගම් සමඟ සාකච්ඡා පැවැත්වීම | පවත්වන ලද රැස්වීම් සංඛ්‍යාව (කාර්තුවකට රැස්වීම් 01 බැගින්) | 04 | - | - | 50% | - |
| | අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ ඉදිරිපත් කිරීම | යොමු කරන ලද නිරීක්ෂණ සංඛ්‍යාව | 12 | 100% | - | - | - |
| | විශ්‍රාම වැටුප් චක්‍රලේඛ නිකුත් කිරීම හා උපදෙස් ලිපි නිකුත් කිරීම | නිකුත් කරන ලද චක්‍රලේඛ/ උපදෙස් ලිපි සංඛ්‍යාව | 24 | 100% | - | - | - |
| | පුද්ගලයින් වෙනත් ආයතන සහ දෙපාර්තමේන්තු වේ අනෙකුත් අංශ වෙතින් යොමු කරන ගැටළු සඳහා ප්‍රතිපත්තිමය තීරණ ලබා ගැනීම | ලබා දුන් තීරණ සංඛ්‍යාව | 240 | - | 81% | - | - |

* - ආදායම් ලැබීම්

## 05.
## තිරසාර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්ය සාධනය

### 5.1.හඳුනා ගන්නා ලද තිරසාර සංවර්ධන අරමුණු

| ඉලක්කය/ අරමුණ | ඉලක්කය | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | 0%-49% | 50%-74% | 75%-100% |
| 01.කොතනක හෝ පවතින ඕනෑම ආකාරයකින් වන දුගී බව අවසන් කිරීම. | 1.3. 2030 වන විට සාධාරණ හා තිරසාර හා සමාජ ආරක්ෂණ ක්‍රමයක් පිහිටුවීම හා වැඩිදියුණු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. | 1.3.1.f.i. රජයේ විශ්‍රාම වැටුපක් ලබන වයස්ගත පුද්ගලයින්ගේ අනුපාතය (ස්ත්‍රී පුරුෂ භාවය අනුව) | | | |

2024 වර්ෂයේ විශ්‍රාමිකයින් 725,282ක් සඳහා විශ්‍රාම වැටුප් ගෙවීම් සිදු කර ඇති අතර ස්ත්‍රී පුරුෂ භාවය අනුව එම පුද්ගලයින්ගේ අනුපාතය පහත පරිදි දක්වා ඇත.

ස්ත්‍රී - 49.2%
පුරුෂ - 50.8%

### 5.2. තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

මෙරට සෑම පුරවැසියෙකුටම විශ්‍රාම වැටුප් හිමිකමක් ලබාදීමට අදාලව යෝජනා ඉදිරිපත් කරමින් “සැමට විශ්‍රාම” ප්‍රතිපත්තිමය යෝජනාවලිය ප්‍රතිපත්තිමය තීරණ ගනු ලබන ආයතන වෙත ඉදිරිපත් කර ඇති අතර එය රාජ්‍ය ප්‍රතිපත්ති මත ද තීරණය වන්නකි.

එමෙන්ම විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මගින් විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය, වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු ආඥා පනත ආදී නෛතික රාමු හා රීතීන්ට හා ප්‍රතිපත්ති තීරණවලට අනුව විශ්‍රාම වැටුපක් ලබන වයස්ගත පුද්ගලයින්ගේ අනුපාතය (ස්ත්‍රී පුරුෂ භාවය අනුව) රාජ්‍ය සේවයට බඳවා ගැනීමේ ප්‍රතිපත්ති හා බද්ධ වේ.

තවද විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත වගකීම් යොමුවන බව සඳහන් උප දර්ශකය (1.3.1.f.i.) වන රජයේ විශ්‍රාම වැටුපක් ලැබෙන වයස්ගත ජනගහනය - ස්ත්‍රී පුරුෂ භාවය අනුව හුදෙක් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මගින් පමණක් කළමනාකරණය කළ නොහැකිය. අර්ධ රාජ්‍ය ආයතන සේවක අර්ථසාධක අරමුදල වැනි පසු විශ්‍රාම ප්‍රතිලාභ ක්‍රමවේද පවතින අතර, තාවකාලික රැකියා සහ ස්වයං රැකියා සඳහා විශ්‍රාම වැටුප් ක්‍රමවේදයක් ඇති කිරීමට නම් එයට අදාල වන සියළු අංශ සහ ආයතන එක්ව කටයුතු කළ යුතු වන අතර මේ සඳහා සියළු ආයතන සමඟ සම්බන්ධතා පවත්වනු ලබන කම්කරු දෙපාර්තමේන්තුව, සමාජ සේවා අමාත්‍යාංශය හා කෘෂි රක්ෂණ මණ්ඩලය වැනි ආයතනයන්හි දායකත්වය ලබා ගත යුතුවේ. එබැවින් එවැනි ආයතන මැදිහත්වීමකින් තොරව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මගින් පමණක් අදාල ඉලක්ක, දත්ත හා ප්‍රගතිය මැනීමේ දර්ශක යනාදිය හඳුනා ගැනීම ප්‍රායෝගික නොවේ.

# 06.
# මානව සම්පත් පැතිකඩ

## 6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | පුරප්පාඩු (අතිරික්ත) |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 35 | 27 | 08 |
| තෘතියික | 11 | 10 | 01 |
| ද්විතියික | 1,102 | 1,030 | 72 |
| ප්‍රාථමික | 97 | 76 | 21 |
| **එකතුව** | **1,245** | **1,143** | **102** |

## 6.3. මානව සම්පත් සංවර්ධනය

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | පුහුණු වැඩසටහනේ කාල සීමාව | සමස්ථ ආයෝජන (රු) | | වැඩසටහනේ ස්වාභාවය (විදේශීය/ දේශීය) |
|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | |
| විමධ්‍යගත විශ්‍රාම වැටුප් අයදුම්පතක් නිවැරදිව යොමු කිරීම සම්බන්ධව රාජ්‍ය ආයතනවල විෂය නිලධාරීන් දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන | 197 | පෙ.ව 9.30 - ප.ව 12.30 | මාර්ගගත | | දේශීය |
| මධ්‍යගත විශ්‍රාම වැටුප් අයදුම්පතක් නිවැරදිව යොමු කිරීම සම්බන්ධව රාජ්‍ය ආයතනවල විෂය නිලධාරීන් දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන | 745 | පෙ.ව 9.30 - ප.ව 12.30 | මාර්ගගත | | |
| විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරීන් සඳහා ලිපි ගනුදෙනු සිදු කිරීම සම්බන්ධ එක්දින පුහුණු වැඩසටහන. | 21 | දින 1/2 පෙ.ව 9.00 ප.ව 3.00 | 14,400.00 වි.වැ.දෙ. | | |
| විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ ද්විතියීක මට්ටමේ නිලධාරීන් සඳහා Microsoft Word පුහුණු වැඩසටහනක් පැවැත්වීම. | 99 | දින 02 | 3600.00 වි.වැ.දෙ. | | |
| මරණ පාරිතෝෂික ගෙවීම සම්බන්ධයෙන් රාජ්‍ය අංශයේ විෂය නිලධාරීන් දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන | 497 | පැය 02 පෙ.ව 10.00 - ප.ව 12.00 | මාර්ගගත | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ තොරතුරු තාක්ෂණ පද්ධතීන් වෙත යොමු වීමේදී ඇතිවන ගැටලු සම්බන්ධව දෙපාර්තමේන්තු තොරතුරු තාක්ෂණ අංශය සමග සාකච්ඡා කිරීම සඳහා වන මාර්ගගත සැසිය | 154 | පෙ.ව 9.30 - ප.ව 12.30 | මාර්ගගත | | දේශීය |
| දායක මුදල් ආපසු ගෙවීමේ විෂය පිළිබඳව රාජ්‍ය ආයතනයන්හි විෂය නිලධාරීන් දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන | 853 | පෙ.ව 9.30 - ප.ව 1.00 | මාර්ගගත | | |
| විමධ්‍යගත විශ්‍රාම වැටුප් අයදුම්පතක් නිවැරදිව යොමු කිරීම සම්බන්ධව රාජ්‍ය ආයතනවල විෂය නිලධාරීන් දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන (දමිළ මාධ්‍ය පුහුණුව) | 114 | පෙ.ව 9.30 - ප.ව 12.30 | මාර්ගගත | | |
| අනුරාධපුර දිස්ත්‍රික්කයේ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට අයත් විෂය නිලධාරීන් හා පදවි ශ්‍රී පුර, වැලිඔය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි මෙම දෙපාර්තමේන්තුවට අයත් නවක විෂය නිලධාරීන් සඳහා විශ්‍රාම වැටුප් ගෙවීම සම්බන්ධව පුහුණු වැඩසටහනක් පැවැත්වීම | 40 | දින 02 | අනුරාධපුර දි.ලේ.කා. | | |
| මධ්‍යගත විශ්‍රාම වැටුප් අයදුම්පතක් නිවැරදිව යොමු කිරීම සම්බන්ධව රාජ්‍ය ආයතනවල විෂය නිලධාරීන් දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන (දමිළ මාධ්‍ය පුහුණුව) | 263 | පෙ.ව 9.30 - ප.ව 12.30 | මාර්ගගත | | |
| වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීමේදී ඇතිවන ගැටලු සම්බන්ධව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි නිලධාරීන් සමග සාකච්ඡා කිරීම සඳහා වූ මාර්ගගත සැසිය | 285 | පෙ.ව 9.30 - ප.ව 12.30 | මාර්ගගත | | |
| විදේශ විශ්‍රාම වැටුප් ගෙවීම සම්බන්ධයෙන් වන ගැටලු සාකච්ඡා කිරීම සම්බන්ධයෙන් වන මාර්ගගත සැසිය | 235 | පෙ.ව 9.00 - ප.ව 12.00 | මාර්ගගත | | |
| හමුදා විශ්‍රාම වැටුප් ගෙවීම සම්බන්ධයෙන් වන ගැටලු සාකච්ඡා කිරීම සම්බන්ධයෙන් වන මාර්ගගත සැසිය | 266 | පෙ.ව 9.00 - ප.ව 12.00 | මාර්ගගත | | |
| DS Portal සහ මාසික විශ්‍රාම වැටුප් ගෙවීම සම්බන්ධ පුහුණු වැඩසටහන | 153 | පෙ.ව 9.30 - ප.ව 1.30 | මාර්ගගත | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ ද්විතීක මට්ටමේ නිලධාරීන් සඳහා පැය 150 දෙමළ පාඨමාලාව | 74 | පැය 150 | 37,500.00 (අවසන් පැය 50 සඳහා) | | දේශීය |
| විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික මට්ටමේ නිලධාරීන් සඳහා පැය 100 දෙමළ පාඨමාලාව | 11 | පැය 100 | 31,730.76 ධීවර හා ජලජ සම්පත් දෙපා. | | |
| විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන් සඳහා පැය 200 දෙමළ පාඨමාලාව | 02 | පැය 200 | මාර්ගගත | | |
| විවෘත හා වගකිව යුතු රජයක් සඳහා රජයේ නිලධාරීන්ගේ වගකීම පුහුණු වැඩසටහනෙහි,<br><br>විවෘත හා වගකිව යුතු රජයක් සඳහා රජයේ නිලධාරීන්ගේ වගකීම පිළිබඳ වූ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 27/2023 ක්‍රියාවට නැංවීම සැසිය හා<br><br>රාජ්‍ය නිලධාරීන් වගකීමෙන් බැහැරවීම හේතුවෙන් අගතියට පත්වන පාර්ශවයන්ට සහන සැලැසීම. | 67 | පෙ.ව 10.30 - ප.ව 12.30 | 2400.00 වි.වැ.දෙ. | | |
| විවෘත හා වගකිව යුතු රජයක් සඳහා රජයේ නිලධාරීන්ගේ වගකීම පුහුණු වැඩසටහනෙහි, වගකීමෙන් යුතු රාජකාරී ඉටු කිරීම සඳහා හිමිවන විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ සැසිය | 60 | පෙ.ව 9.30 - ප.ව 11.00 | වි.වැ.දෙ. | | |
| උක්ත වැඩසටහනෙහි අල්ලස් හා දූෂණයෙන් තොර රාජ්‍ය සේවයක් ගොඩ නැංවීම සැසිය | 60 | පෙ.ව 11.00 - ප.ව 12.30 | වි.වැ.දෙ. | | |
| විවෘත හා වගකිව යුතු රජයක් සඳහා රජයේ නිලධාරීන්ගේ වගකීම පුහුණු වැඩසටහනෙහි,<br><br>කාර්යක්ෂම හා ඵලදායී සේවාව ලබාදීමේදී රාජ්‍ය නිලධාරීන් අවධානය යොමු කළ යුතු කරුණු හා වගකිව යුතු රාජ්‍ය සේවයක් සඳහා සුරැකීම | 52 | පෙ.ව 9.30 - ප.ව 12.30 | 46,740.00 වි.වැ.දෙ. (සංග්‍රහ වියදම් ඇතුළුව) | | |
| විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට අයත් ද්විතියීක මිටටමේ නිලධාරීන් සඳහා ස්වයං අභිප්‍රේරණය හා පුද්ගල සංවර්ධනය පුහුණුව | 95 | ප.ව 12.30 - ප.ව 3.30 | 62,420.00 වි.වැ.දෙ. (සංග්‍රහ වියදම් ඇතුළුව) | | |
| රියදුරු මහතුන් සඳහා රිය ධාවනයේ කුසලතාවය හා ආකල්ප වර්ධනය පිළිබඳ පුහුණු වැඩසටහන | 10 | දින 01 | 9,240.00 වි.වැ.දෙ. (සංග්‍රහ වියදම් ඇතුළුව) | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට අයත් ද්විතියික මට්ටමේ නිලධාරීන් සඳහා මුදල් රෙගුලාසි සම්බන්ධ පුහුණු වැඩසටහන | 72 | දින 01 | 130,000.00 වි.වැ.දෙ. | | දේශීය |
| වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම සම්බන්ධයෙන් වන ගැටලු සාකච්ඡා කිරීමේ පුහුණු වැඩසහන | 206 | දින 01 | මාර්ගගත | | |
| සත්කාර පියස රාජකාරි කටයුතුවල නිරත නිලධාරීන් සඳහා දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන | 16 | දින 01 | 15,360.00 වි.වැ.දෙ. (සංග්‍රහ වියදම් ඇතුළුව) | | |
| එලදායී සන්නිවේදනය හා අචාර විධි පුහුණුව (1970, සත්කාර පියස හා මහජන දිනය විෂය නිලධාරී සඳහා) | 10 | දින 01 | 75,000.00 ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | | |
| **අධ්‍යයන පාඨමාලා සඳහා** | | | | | |
| තුලක්ෂි ජනගන් මියගේ වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය (CIMA) සඳහා 2024 වාර්ෂික සමාජික ගාස්තුව ගෙවීම ප්‍රතිපූර්ණය කිරීම | 01 | | 144,173.90 | | දේය |
| ඩබ්.සී.එල්. අල්විස් මියගේ ජාත්‍යන්තර සබඳතා පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාව සඳහා ඉතිරිව ඇති මුදල් ගෙවීම. | 01 | වසර 02 | 9,120.00 (ඉතිරි මුදල) | | |
| අනෝමා ප්‍රියංකා මිය සහභාගීවන Microsoft Excel පුහුණු වැඩමුළුව සඳහා ගෙවීම් සිදු කිරීම. | 01 | දින 02 | 16,500.00 | | |
| ඩී.ඒ.ඒ සඳමාලි මිය සහභාගීවන Microsoft Excel පුහුණු වැඩමුළුව සඳහා ගෙවීම් සිදු කිරීම. | 01 | දින 02 | 16,500.00 | | |

**වෙනත් ආයතන මගින් පවත්වනු ලැබූ පුහුණු වැඩසටහන් සඳහා සම්බන්ධ වීම**

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | පුහුණු වැඩසටහනේ කාල සීමාව | සමස්ථ ආයෝජන (රු) | | වැඩසටහනේ ස්වාභාවය (විදේශීය/ දේශීය) |
|---|---|---|---|---|---|
| | | | **දේශීය** | **විදේශීය** | |
| Public Procurement Procedures | 2 | දින 02 | 26,000.00 SDFL ශ්‍රවනාගාරය | | දේශීය |
| පුද්ගලික ලිපි ගොනුවක් පවත්වාගෙන යාම | 1 | දින 02 | 13.000.00 SDFL ශ්‍රවනාගාරය | | |
| අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කරන සුපිළිපන් නිලධාරීන් පුහුණු කිරීමේ වැඩසටහන | 1 | දින 01 | රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කරන දූෂණ විරෝධී පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන | 1 | දින 03 | රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | | |
| රාජ්‍ය නිලධරයන්ගේ වැටුප් විධිවිධාන පිළිබඳ වැඩමුළුව | 1 | දින 01 | 7,500.00 දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය | | |
| Advocacy workshop on Injury prevention and basic first aid (Ministry of Health) | 1 | දින 01 | ශ්‍රී ලංකා පදනම් ආයතනය | | |
| පරිපාලන නිලධාරීන් සතු වගකීම හා කාර්යභාරය | 1 | දින 2 | 13,000.00 SDFL ශ්‍රවනාගාරය | | |
| රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් “B” ගිණුම පිළියෙල කිරීම. | 2 | දින 1 | 14,000.00 SDFL ශ්‍රවනාගාරය | | දේශීය |
| රාජ්‍ය ගිණුම්කරණ ක්‍රමවේදය දැනුවත් කිරීම සහ අවසන් ගිණුම් පිළියෙල කිරීම සඳහා වූ දෙදින වැඩමුළුව පුහුණුව | 2 | දින 2 | 26,000.00 SDFL ශ්‍රවනාගාරය | | |
| රාජ්‍ය නිලධරයන්ගේ වැටුප් සකස් කිරීම | 1 | දින 1 | 5,000.00 ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | | |
| අමාත්‍ය මණ්ඩල සංදේශ පිළියෙල කිරීම | 1 | දින 1 | 7,000.00 SDFL ශ්‍රවනාගාරය | | |
| Government Payroll | 2 | දින 3 | 42,000.00 SDFL ශ්‍රවනාගාරය | | |
| වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය හා වත්කම් අපහරණය | 1 | දින 02 | 13,000.00 SDFL ශ්‍රවනාගාරය | | |
| පුද්ගලික ලිපි ගොනු සම්බන්ධ පුහුණු වැඩසටහන | 1 | දින 02 | 13,000.00 SDFL ශ්‍රවනාගාරය | | |
| ප්‍රසම්පාදනය පිළිබඳ පුහුණු වැඩසටහන | 2 | දින 02 | 26,000.00 SDFL ශ්‍රවනාගාරය | | |
| 42nd National IT Conference 2024 වැඩසටහන | 1 | දින 02 | 30,000.00 Computer Society of S.L | | |
| ප්‍රසම්පාදනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | 1 | දින 02 | 25,000.00 ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | | |
| වර්තමාන කාර්යාල ක්‍රම හා කාර්යාල කළමනාකරණය | 1 | දින 02 | 13,000.00 SDFL ශ්‍රවනාගාරය | | දේශීය |
| විනය කාර්ය පටිපාටිය | 1 | දින 02 | 13,000.00 SDFL ශ්‍රවනාගාරය | | |

## 07.
## අනුකූලතා වාර්තාව

| අංකය | අදාල කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 1. | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | | |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | | |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම (වාණිජ අත්තිකාරම් ගිණුම) | අදාල නොවේ | | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම | | | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම | | | |
| 1.6 | වෙනත් | | | |
| 2. | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම් (මු.රෙ.445)** | | | |
| 2.1 | රා.ප.ච. 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලින කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛනය/පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.5 | සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලින කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.11 | උප පත්‍රිකා ලේඛනය (GA - N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| **3.** | **මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභියෝජනය කිරීම (මු.රෙ.135)** | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ පවරා දී තිබීම | අනුකූල වේ | | |
| 3.2 | මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ | | |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම | අනුකූල වේ | | |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| **4.** | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලසුම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **5.** | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපති විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම | අනුකූල නොවේ | කාල ප්‍රමාදයක් පවතී | |
| **6.** | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මුදල් රෙගුලාසි 134 (2) DMA/1-2019 අනුව වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලසුම සකස් කිරීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුලදී පිළිතුරු සපයා තිබීම | අනුකූල වේ | | |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **7.** | **විගණන හා කළමනාකරණ කමිටුව** | | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම | අනුකූල වේ | | |
| **8.** | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම | අනුකූල වේ | | |
| 8.3 | රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ අංක 01/2020 අනුව භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වු අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම | අනුකූල වේ | | |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිරීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| **9.** | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් සහ මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 9.2 | වාහන ගර්හිත වී මාස 6කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම | අනුකූල වේ | | |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මුදල් රෙගුලාසි 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 30/2016 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | අනුකූල වේ | | |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම | අනුකූල වේ | | |
| **10.** | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| **11.** | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 11.2 | මු.රෙ.94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එලඹීම | අනුකූල වේ | | |
| **12.** | **රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම** | | | |
| 12.1 | සීමාවන් වලට අනුකූල වීම | අනුකූල වේ | | |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම | අනුකූල වේ | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම | අනුකූල නොවේ | අයකර ගැනීමට හෝ පොත්වලින් කපාහැරීමට ක්‍රියාමාර්ග ගෙන ඇත. | |
| **13.** | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම | අනුකූල වේ | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| **14.** | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | අනුකූල වේ | | |
| 14.2 | මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 14.3 | මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | අනුකූල වේ | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම | අනුකූල වේ | | |
| **15.** | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 15.2 | රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම | අනුකූල වේ | | |
| 15.3 | මු.රෙ.176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **16.** | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්යය මණ්ඩල සීමාව තුළ කාර්යය මණ්ඩලය පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 16.2 | කාර්යය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම | අනුකූල වේ | | |
| 16.3 | 2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියළුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **17.** | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම | අනුකූල වේ | | |
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| **18.** | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම | අනුකූල නොවේ. | ආයතනයේ කාර්යභාරයට අනුකූලව සකස් කරන ලද පුරවැසි ප්‍රඥප්තියක් ක්‍රියාත්මක වේ. | |

| | | | | |
|---|---|---|---|---|
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ජේදය පරිදි, පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | අනුකූල නොවේ. | | |
| **19.** | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම | අනුකූල නොවේ | ආයතනයේ අවශ්‍යතාවයට ගැලපෙන පරිදි මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර ඇත. | හැකිතාක් රා.ප.ච.02/2018 චක්‍රලේඛයට අනුකූලව මානව සම්පත් සැලැස්ම සකස් කිරීමට උත්සාහ කිරීම. |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම | අනුකූල වේ | | |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 1 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්යය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම | අනුකූල නොවේ | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018(I) අනුව වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කිරීම අවශ්‍ය නොවේ. | |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ජේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධනය සැලැස්ම පිළියෙල කිරීම ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම" නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම | අනුකූල වේ | | |
| **20.** | **විගණන ජේද වලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ජේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | අනුකූල වේ | | |

ශ්‍රී ලංකා විශ්‍රාම
இலங்கை ஓய்வு
Sri Lanka Pensions

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව, මාළිගාවත්ත, කොළඹ 10
ஓய்வூதியத் திணைக்களம், மாளிகாவத்தை, கொழும்பு -10.
Department of pensions, Maligawaththa, Colombo 10

www.pensions.gov.lk